# 2

# ජාතික නිෂ්පාදිතය සහ වියදම

## 2.1 සමස්ත නිරීක්ෂණ

2010 වසරේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) 2009 **වසරෙහි පැවැති සියයට 3.5 ක පහළ වර්ධනයට සාපේක්ෂව සියයට 8.0 ක ආකර්ෂණීය වූ වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙය පසුගිය දශක හය තුළ වාර්තා වූ දෙවැනි ඉහළතම වර්ධන අනුපාතය මෙන්ම පසුගිය දශක තුන තුළ වාර්තා වූ ඉහළතම වර්ධන අනුපාතයද විය. අඛණ්ඩව වසර හතරක් සියයට 6.0 ක හෝ ඊට ඉහළ වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරන ලද දේශීය ආර්ථිකය, 2009 වසරේ දී දේශීය හා විදේශීය ආර්ථිකයන්හි පැනනැගුණු අභියෝග හේතුවෙන් මන්දගාමී විය. එසේ වුවද, වසර පුරාම රට තුළ පැවැති සාමකාමී වාතාවරණයත්, දේශීය හා විදේශීය අංශයන්හි වූ වඩාත් හිතකර තත්ත්වයන්ද තුළින් සමස්ත ආර්ථික වර්ධනය සඳහා වූ උත්තේජනීය පසුබිම හේතුකොට ගෙන ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්විය. තව ද, දේශීයව පැවති යහපත් කාලගුණික තත්ත්වයන් සමඟින් ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම ද 2010 වසරේ ඉහළ වර්ධනයට ධනාත්මකව දායක විය.

**2010 වසරේ සමස්ත ආර්ථික වර්ධනය සියලුම ප්‍රධාන අංශවල ධනාත්මක දායකත්වය මගින් පුළුල් පදනමකින් සිදු වූවකි.** 2010 වසර තුළ දී කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගය සියයට 7.0 කින් වැඩි වූ අතර, මීට දේශීය කෘෂිකර්මාන්ත අංශයට අයත් වී වගාව ඉහළ අස්වැන්නක් වාර්තා කිරීම මෙන්ම එළවළු සහ ගොඩ ගොවිතැන් බෝග නිෂ්පාදනය ඉහළ යාම සහ මත්ස්‍ය නිෂ්පාදනයේ කැපීපෙනෙන ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් දායක විය. අපනයන කෘෂිකර්මයට අයත් තේ නිෂ්පාදනය 2009 වසරේ පහළ මට්ටමක පැවතියද 2010 වසරේ එය ආර්ථික වර්ධනයට හිතකර දායකත්වයක් ලබා දුන් අතර, සුළු අපනයන බෝග නිෂ්පාදනයේ ද ඉහළ ක්‍රියාකාරිත්වයක් පැවතුණි. සියලුම උප අංශයන්හි ඉහළ වර්ධනයත් සමඟ කාර්මික අංශය 2010 වසරේ සියයට 8.4 ක වර්ධනයක් දැක්වීය. ඉදිකිරීම්, පතල් හා කැණීම් සහ විදුලිය උප අංශවල සැලකිය යුතු වර්ධනයත් සමඟ කර්මාන්තශාලා නිෂ්පාදන උප අංශයේ නිෂ්පාදනය ද ඉහළ අගයකින් වර්ධනය විය. විදේශීය වෙළෙඳාමේ මන්දගාමී ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2009 වසරේ සැලකිය යුතු මට්ටමකින් පහළ ගිය සේවා අංශයේ වර්ධනය 2010 වසරේ දී සියයට 8.0 ක වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් විය. ඉහළ නැගුණු දේශීය ඉල්ලුම සහ ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් තොග සහ සිල්ලර

**2.1 සංඛ්‍යා සටහන** **කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය (2002 ස්ථාවර මිල අනුව)**

| අංශය | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි.හි වෙනස්වීමේ දායකත්වය (%) | | ද.දේ.නි.යට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) |
| **කෘෂිකාර්මික** | **3.2** | **7.0** | **11.0** | **10.5** | **12.0** | **11.9** |
| **1 කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය** | **2.8** | **6.4** | **8.8** | **8.7** | **10.9** | **10.7** |
| 1.1 තේ | - 8.4 | 13.1 | - 2.8 | 1.7 | 1.0 | 1.1 |
| 1.2 රබර් | 7.9 | 12.7 | 0.5 | 0.4 | 0.3 | 0.3 |
| 1.3 පොල් | 5.3 | - 14.3 | 2.0 | - 2.4 | 1.4 | 1.1 |
| 1.4 සුළු අපනයන බෝග | 5.2 | 37.6 | 0.7 | 2.1 | 0.5 | 0.6 |
| 1.5 වී | - 5.1 | 17.5 | - 2.7 | 3.7 | 1.7 | 1.8 |
| 1.6 පශු සම්පත් | 6.2 | 2.9 | 1.5 | 0.3 | 0.9 | 0.8 |
| 1.7 අනෙකුත් ආහාර බෝග | 7.0 | 4.4 | 7.5 | 2.1 | 3.9 | 3.8 |
| 1.8 වතු සංවර්ධනය | 5.2 | 5.4 | 0.4 | 0.2 | 0.3 | 0.3 |
| 1.9 දැව සහ වන සම්පත් | 5.9 | 3.1 | 1.0 | 0.2 | 0.6 | 0.6 |
| 1.10 වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන | 5.1 | 7.6 | 0.5 | 0.4 | 0.4 | 0.4 |
| **2 ධීවර කර්මාන්තය** | **6.9** | **12.2** | **2.2** | **1.8** | **1.2** | **1.2** |
| **කාර්මික** | **4.2** | **8.4** | **33.9** | **30.1** | **28.6** | **28.7** |
| **3 පතල් සහ කැණීම්** | **8.2** | **15.5** | **4.7** | **4.1** | **2.1** | **2.3** |
| **4 නිෂ්පාදන කර්මාන්ත** | **3.3** | **7.3** | **16.3** | **16.0** | **17.4** | **17.3** |
| 4.1 සැකසුම් (තේ, රබර් සහ පොල්) | 0.7 | 5.8 | 0.1 | 0.4 | 0.6 | 0.6 |
| 4.2 කර්මාන්තශාලා නිෂ්පාදන | 3.4 | 7.5 | 15.2 | 14.8 | 15.8 | 15.7 |
| 4.3 ගෘහ කර්මාන්ත | 3.3 | 5.5 | 1.0 | 0.7 | 1.1 | 1.1 |
| **5 විදුලිය, ගෑස් සහ ජලය** | **3.7** | **7.8** | **2.5** | **2.3** | **2.4** | **2.4** |
| 5.1 විදුලිය | 3.7 | 8.2 | 2.2 | 2.2 | 2.1 | 2.1 |
| 5.2 ගෑස් | 5.4 | 4.6 | 0.3 | 0.1 | 0.2 | 0.2 |
| 5.3 ජලය | 2.9 | 4.5 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| **6 ඉදිකිරීම්** | **5.6** | **9.3** | **10.3** | **7.7** | **6.6** | **6.7** |
| **සේවා** | **3.3** | **8.0** | **55.2** | **59.4** | **59.3** | **59.3** |
| **7 තොග සහ සිල්ලර වෙළෙඳාම** | **- 0.2** | **7.5** | **- 1.4** | **21.7** | **23.3** | **23.2** |
| 7.1 ආනයන වෙළෙඳාම | - 8.2 | 9.5 | - 20.8 | 9.4 | 8.0 | 8.1 |
| 7.2 අපනයන වෙළෙඳාම | - 2.2 | 3.4 | - 2.7 | 1.8 | 4.2 | 4.0 |
| 7.3 දේශීය වෙළෙඳාම | 7.3 | 7.6 | 22.1 | 10.5 | 11.1 | 11.1 |
| **8 හෝටල් සහ ආපනශාලා** | **13.3** | **39.8** | **1.4** | **2.0** | **0.4** | **0.5** |
| **9 ප්‍රවාහනය සහ සන්නිවේදනය** | **6.3** | **11.9** | **23.4** | **19.9** | **13.5** | **13.9** |
| 9.1 ප්‍රවාහනය | 5.9 | 11.4 | 18.1 | 15.8 | 11.1 | 11.5 |
| 9.2 භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා | 0.4 | 16.8 | 0.1 | 1.4 | 0.7 | 0.7 |
| 9.3 තැපැල් සහ විදුලි සංදේශ | 11.7 | 13.2 | 5.2 | 2.8 | 1.7 | 1.8 |
| **10 බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය** | **5.7** | **7.5** | **14.1** | **8.4** | **8.9** | **8.9** |
| **11 නිවාස අයිතිය** | **1.3** | **0.9** | **1.1** | **0.3** | **3.0** | **2.8** |
| **12 රාජ්‍ය සේවා** | **5.9** | **5.4** | **12.8** | **5.3** | **7.8** | **7.6** |
| **13 පෞද්ගලික සේවා** | **5.8** | **5.8** | **3.9** | **1.8** | **2.4** | **2.4** |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **3.5** | **8.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | 49.8 | -20.1 | | | | |
| **දළ ජාතික නිෂ්පාදිතය** | **4.8** | **7.9** | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වෙළෙඳාම් උප අංශය වර්ධනය විය. ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයත් සමඟ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් පුළුල් වූ අතර මූල්‍ය සේවාවන් ද 2010 වසර තුළ ඉහළ වේගයකින් වර්ධනය විය.


**2009 වසරේ දී දේශීය ඉල්ලුමෙහි වූ සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී වාර්තා කළ සියයට 10.2 ක වර්ධනය මඟින් සමස්ත වර්ධනය ළඟා කර ගැනීමේ දී දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල දායකත්වය පෙන්නුම් කෙරේ.** 2009 වසරේ දී සියයට 3.6 ක වර්ධනයට සාපේක්ෂව දේශීය පරිභෝජන ඉල්ලුම මෙම වසරේ දී සියයට 8.4 ක ඉහළ අගයකින් වර්ධනය විය. පාරිභෝගික ඉල්ලුමෙහි මෙම වැඩිවීමට විශේෂයෙන්ම යුද වාතාවරණයේ බලපෑමට ලක් වූ ජන ජීවිතය යථා තත්ත්වයට පත් වීම සමඟ ආර්ථික ක්‍රියාකාරකම්වල ඇති වූ සමස්ත ප්‍රගතිය දායක විය. මැදිකාලීනව ඉහළ ආර්ථික වර්ධනයක් ලබා ගැනීමේ දී අත්‍යවශ්‍ය සාධකයක් වන ආයෝජනය මත කරණු ලබන වියදම 2010 වසරේදී සියයට 15.5 ක ඉහළ වර්ධන ගම්‍යතාවයක් පෙන්නුම් කරනු ලැබීය.

**විශේෂ සටහන 3**

## ඒක පුද්ගල ආදායම දෙගුණයක් කරා ළඟා වීම

ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඒක පුද්ගල ද.දේ.නි.) යනු කිසියම් රටක වෙසෙන ජනතාවගේ භෞතික ජීවන තත්ත්වය පිළිඹිබු කරනු ලබන දර්ශකයකි. එය වෙළෙඳපොළ මිල අනුව ගණනය කරන ලද ද.දේ.නි. රටෙහි මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් බෙදීමෙන් ඇස්තමේන්තු කරනු ලබයි.[1] අන්තර්ජාතික සංසන්දනයන් සඳහා එහි අගය එ.ජ. ඩොලර් වටිනාකම මගින් ප්‍රකාශයට පත් කෙරේ.

**රූප සටහන වි.ස. 3.1** — **ඒක පුද්ගල ද.දේ.නි. 1960-2010 (එ.ජ. ඩොලර්)**




ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ද.දේ.නි. 1960[2] වසරේ දී එ.ජ.ඩොලර් 142 ක් ලෙස පැවති අතර, මෙම අගය එ.ජ.ඩොලර් 281 ක් ලෙස දෙගුණ වූයේ තවත් වසර 15 කට පසුව එනම් 1975 වර්ෂයේ දීය. නැවතත් එ.ජ.ඩොලර් 547 ක් සහ එ.ජ. ඩොලර් 1,062 ක් ලෙස පිළිවෙළින් වසර 16 කට සහ වසර 13 කට පසුව, එනම් 1991 හා 2004 වසර වලදී එය දෙගුණ වීමේ සන්ධිස්ථානයන් සනිටුහන් කරනු ලැබීය. කෙසේ වෙතත්, ස්ථාවර සාර්ව ආර්ථික තත්ත්වයන් සමඟ වසරකට සියයට 6 කට වඩා වැඩි සාමාන්‍ය වර්ධන වේගයක් පැවති වාතාවරණයක් තුළ ඒක පුද්ගල ද.දේ.නි. වසර 4 ක් වැනි කෙටි කාල පරාසයක දී (2004 සහ 2008 අතර) නැවත දෙගුණ වෙමින් 2008 වසරේ දී එ.ජ. ඩොලර් 2,014 ක් වෙත ළඟා විය. ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම් කාණ්ඩයේ රටක් ලෙස වර්ගීකරණය කර ඇත.[3]

**සංඛ්‍යා සටහන වි.ස. 3.1** — **ඒක පුද්ගල ද.දේ.නි. දෙගුණ වීමට ගත වූ කාලය (1960-2008)**

| වර්ෂය | 1960 | 1975 | 1991 | 2004 | 2008 |
|---|---|---|---|---|---|
| ඒක පුද්ගල ද.දේ.නි. එ.ජ. ඩොලර් | 142 | 281 | 547 | 1,062 | 2,014 |
| දෙගුණ වීමට ගතවූ වසර ගණන (ආසන්න වශයෙන්) | - | 15 | 16 | 13 | 4 |

දශක තුනක් තිස්සේ පැවති අභ්‍යන්තර ගැටුම් නිමාවීම, ආයෝජන විශ්වාසය වැඩිවීම, යටිතල පහසුකම් වැඩිදියුණු වීම නිසා රටේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ යාම සහ ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සමඟ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන විභවතාවයන් සැලකිය යුතු මට්ටමකින් වැඩි දියුණු විය. දේශීය කෘෂිකර්මාන්තය වර්ධනය වීම සහ කාලානුරූප ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති හේතුකොට ගෙන ඉදිරි වසරවල දී සැලකිය යුතු මිල පීඩනයක් ඇති වේ යයි අපේක්ෂා නොකෙරේ. එමෙන්ම රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය මගින් ඉල්ලුම් කළමනාකරණය ඉලක්ක කෙරෙනු ලබන අතර, වැඩි වූ ආයෝජන විශ්වාසය තුළින් ජනිත වූ විදේශ ආයෝජන ප්‍රවාහයෙහි දායකත්වය විනිමය අනුපාතිකයේ ස්ථාවරත්වය ශක්තිමත් කෙරෙනු ඇත. රටේ සාර්ව ආර්ථිකයේ අපේක්ෂිත මෙම තත්ත්වයන් අඛණ්ඩව පැවතුන හොත් මධ්‍ය කාලීනව සියයට 8 කට වඩා ඉහළ වර්ධනයක් අත්කර ගැනීමට හැකි වනු ඇත.

2011-2014 දක්වා කාලපරිච්ඡේදය සඳහා ඒක පුද්ගල ද.දේ.නි. ඇස්තමේන්තු පහත සංඛ්‍යා සටහනේ පෙන්නුම් කෙරේ. මේ සඳහා භාවිතා කරන ලද උපකල්පන 1.5 සංඛ්‍යා සටහනේ දැක්වේ.

**සංඛ්‍යා සටහන වි.ස. 3.2** — **ඒක පුද්ගල ද.දේ.නි. පුරෝකථනයන්**


| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| ඒක පුද්ගල ද.දේ.නි. පුරෝකතනයන් එ.ජ. ඩොලර් | 2,794 | 3,200 | 3,660 | 4,190 |

[1] ඒක පුද්ගල ද.දේ.නි. = $\frac{\text{ද.දේ.නි. (පවත්නා වෙළෙඳපොළ මිල අනුව)}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}}$

[2] ශ්‍රී ලංකා මහ බැංකුව ද.දේ.නි. ප්‍රකාශයට පත් කරන ලද්දේ 1959 වසරේ සිටය.

[3] ලෝක බැංකු වර්ගීකරණයට අනුව ඒක පුද්ගල දළ ජාතික ආදායම මත ආදායම් කාණ්ඩ ප්‍රකාශයට පත්කර ඇත්තේ පහළ ආදායම් (ඩොලර් 995 ට අඩු), පහළ මැදි ආදායම් (ඩොලර් 996-ඩොලර් 3,935), ඉහළ මැදි ආදායම් (ඩොලර් 3,936-ඩොලර් 12,195) සහ ඉහළ ආදායම් (ඩොලර් 12,196 හෝ ඊට වැඩි) ලෙසිනි.

**2.1 රූප සටහන** **වාර්ෂික වර්ධන අනුපාතික**




මන්දගාමී ගෝලීය ආර්ථික තත්ත්වය නිසා 2009 වසරේ දී ආනයන හා අපනයන යන දෙඅංශයෙන්ම පසුබෑමකට ලක් වූ විදේශීය වෙළෙඳාම් අංශය 2010 වසරේ දී සැලකිය යුතු මට්ටමකින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ඉල්ලුම ඉහළ යාම හමුවේ වැඩි වේගයකින් වර්ධනය වූ ආනයන ඉල්ලුම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම 2010 වසර තුළ දී පුළුල් විය.

**දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) එනම් විදේශීය ශුද්ධ සාධක ආදායමට (වි.ශු.සා.ආ.) ගලපන ලද ද.දේ.නි. 2010 වසරේ දී සියයට 7.9 කින් වර්ධනය විය.** ද.දේ.නි. වර්ධනයට සාපේක්ෂව ද.ජා.නි මෙලෙස අඩුවීමට හේතු වූයේ 2009 වසරේ වර්ධනය වූ වි.ශු.සා.ආ. 2010 වසරේදී පහළ වැටීමය. විදේශීය සාධක ආදායම්හි ලැබීම් හා ගෙවීම් යන දෙඅංශයම 2010 වසරේ දී වර්ධනය වූ අතර, ගෙවීම් වඩා වැඩි වේගයකින් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස වි.ශු.සා.ආ. හි සෘණාත්මක වර්ධනයක් පෙන්වීය.

**2010 වසරේ දී ඒක පුද්ගල ද.දේ.නි. 2009 වසරේ පැවැති රුපියල් 236,445 ක අගයේ සිට රුපියල් 271,259 ක් දක්වා සියයට 14.7 කින් වැඩි වූ අතර මෙය උද්ධමන අනුපාතිකය (සියයට 5.9) ද ඉක්මවා යාමකි.** එසේම එ.ජ. ඩොලර් වටිනාකමින් ගණනය කළ ඒක පුද්ගල ආදායම 2010 වසරේ දී එ.ජ.ඩොලර් 2,399 ක් වූ අතර එය 2009 වසරේ පැවැති එ.ජ.ඩොලර් 2,057 ට සාපේක්ෂව සියයට 16.6 කින් වැඩි වීමකි.

**2010 වසරේ පවත්නා වෙළෙඳ මිල අනුව ද.දේ.නි. රුපියල් බිලියන 5,602 ක් (එ.ජ.ඩොලර් බිලියන 49.5) දක්වා සියයට 15.9 කින් වැඩි විය.** ද.දේ.නි. හි ඇති වූ මෙම නාමික වර්ධනය එහි වූ සියයට 8.0 ක මූර්ත වැඩි වීම සහ සාමාන්‍ය මිල මට්ටම මනිනු ලබන ද.දේ.නි. අවධමනකය 2009 වසරේ පැවැති සියයට 5.9 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 7.3 දක්වා ප්‍රසාරණය වීමේ ප්‍රතිඵලයකි.

**දේශීය ඉතුරුම් 2009 වසරේ දී වූ සියයට 41.8 ක වර්ධන වේගයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 20.5 ක පහළ අනුපාතයකින් වර්ධනය වූ අතර එය රුපියල් බිලියන 1,045 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** පරිභෝජන අංශයෙහි ඇති වූ ඉහළ වර්ධනය හේතුවෙන් ආනයනික භාණ්ඩ සඳහා වන ඉල්ලුම ඉහළ යාම මෙසේ දේශීය ඉතුරුම්හි වර්ධන වේගය අඩු වීමට හේතු විය. පරිභෝජන, අන්තර් සහ ආයෝජන භාණ්ඩ ඇතුළත් වූ ආනයන භාණ්ඩවල රුපියල් වටිනාකම 2009 වසරේ දී වූ සියයට 23.1 ක අඩු වීමට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 30.2 කින් වර්ධනය විය. 2009 වසරේ දී සියයට 17.9 ක් වූ දේශීය ඉතුරුම් අනුපාතය 2010 වසරේ දී සියයට 18.7 ක් දක්වා වැඩි විය.

**ජාතික ඉතුරුම් 2009 වසරට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 20.3 කින් වර්ධනය වූ අතර එහි අගය රුපියල් බිලියන 1,381 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** ශුද්ධ පෞද්ගලික සංක්‍රාම සියයට 21.2 කින් වර්ධනය වීම ජාතික ඉතුරුම්වලට ධනාත්මකව දායක වුව ද වි.ශු.සා.ආ. හි අඩු වීම තුළින් වර්ධන ගාමකත්වය අඩු විය. ශුද්ධ පෞද්ගලික සංක්‍රාම 2009 වසරේ පැවැති රුපියල් බිලියන 337 ක මට්ටමේ සිට 2010 වසරේ දී රුපියල් බිලියන 408 ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, ජාතික ඉතුරුම් අනුපාතය පෙර වසරේ අදාළ අගය වූ සියයට 23.7 ට සාපේක්ෂව 2010 දී සියයට 24.7 ක් ලෙස පැවතුණි.

## 2.2 ආංශික නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටළු

### කෘෂිකාර්මික අංශය

**කෘෂිකාර්මික අංශය පෙර වසරේ වාර්තා කළ සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 7.0 කින් වර්ධනය විය.** විශේෂයෙන්ම වී, තේ සහ සුළු අපනයන බෝග වර්ධනය මෙන්ම ධීවර කර්මාන්ත කටයුතුවල සැලකිය යුතු දියුණුව මෙම අංශයෙහි වර්ධනයට හේතු පාදක විය. කෙසේ නමුත්, පොල් සහ පශු සම්පත් නිෂ්පාදනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු වීම තුළ මෙම අංශයේ වර්ධන ගාමකත්වය යම්තාක් දුරට මන්දගාමී විය. මේ අතර, ආර්ථිකයෙහි අනෙකුත් අංශයන්හි ඉහළ වර්ධනයක් වාර්තා වීම තුළ කෘෂිකාර්මික අංශය දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය ආන්තිකව සියයට 11.9 ක් දක්වා අඩු විය.

**2.2 සංඛ්‍යා සටහන** **කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (1997-2000=100)**

| අයිතමය | 2009 (අ) | 2010 (ආ) | වර්ධන වේගය (%) 2010/09 |
|---|---|---|---|
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 122.4 | 131.6 | 7.5 |
| 1. කෘෂිකර්මය | 122.1 | 130.3 | 6.8 |
| 1.1 කෘෂිකාර්මික බෝග | 119.3 | 128.1 | 7.3 |
| තේ | 101.4 | 114.7 | 13.1 |
| රබර් | 141.9 | 158.7 | 11.8 |
| පොල් | 102.7 | 83.4 | -18.8 |
| වී | 137.0 | 161.4 | 17.8 |
| අනෙකුත් බෝග | 122.5 | 129.1 | 5.4 |
| 1.2 පශු සම්පත් | 146.6 | 150.3 | 2.6 |
| 2. මත්ස්‍ය | 124.4 | 139.7 | 12.3 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## අපනයන බෝග

**2010 වසරේ සමස්ත තේ නිෂ්පාදනය මෙතෙක් පැවැති ඉහළම නිෂ්පාදන මට්ටම වාර්තා කරමින් කිලෝ ග්‍රෑම් මිලියන 329 ක් දක්වා සියයට 13 කින් වර්ධනය විය.** 2009 වසරේ මුල් කාර්තුවේ පැවැති වියළි කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම හේතුවෙන් පහළ ගිය නිෂ්පාදන මට්ටම සැළකිය යුතු ප්‍රමාණයකින් යථා තත්ත්වයට පත්වීමක් මින් පෙන්නුම් කෙරිණ. මේ අතර, සාමාන්‍ය තේ ඵලදාව 2008 වසරේදී පැවැති හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,436 සිට 2010 වසරේ දී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,484 ක් දක්වා ඉහළ ගියේය. 2010 වසරේ මෙම වර්ධනයට විශාල වශයෙන් දායක වූයේ තේ වගා කරන සියලුම දිස්ත්‍රික්කවල, වසරේ අවසාන මාස දෙක තුළ හැර පැවැති හිතකර කාලගුණික තත්ත්වයන්ය. පසුගිය වසරේ සිට නොකඩවා ඉහළ මිල ගණන් පැවතීම නිසා වැඩි දියුණු කළ කෘෂිකාර්මික සහ තේ සැකසීම් ක්‍රම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට වගාකරුවන් යොමුවීම ද මෙම වර්ධනයට හේතු විය. කුඩා තේ වතු හිමියන්ට ලබාදෙන පොහොර සහනය නොකඩවා ක්‍රියාත්මකවීම ද ඵලදායිතාවය ඉහළ යාමට ඉවහල් විය. සමස්ත තේ නිෂ්පාදනයට සියයට 60 ක ඉහළම දායකත්වයක් සපයන පහත රට තේ නිෂ්පාදනය 2010 වසරේ දී කිලෝ ග්‍රෑම් මිලියන 196 ක් දක්වා සියයට 13 කින් වර්ධනය විය. මේ අතර මැදරට හා උඩරට තේ පිළිවෙලින් සියයට 22 කින් සහ සියයට 7 කින් කිලෝ ග්‍රෑම් මිලියන 55 ක් සහ කිලෝ ග්‍රෑම් මිලියන 78 ක් දක්වා වර්ධනය විය. 2010 වසරේ ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනයට සියයට 76.4 ක දායකත්වයක් සැපයූ කුඩා තේ වතු වගා අංශය ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනය තුළ නොකඩවාම ප්‍රධාන ස්ථානය හිමිකර ගන්නා ලදී.

**අනෙකුත් සියලුම ජාත්‍යන්තර තේ වෙන්දේසි හා සසඳන විට කොළඹ තේ වෙන්දේසිය තුළ 2010 වසරේ දී ඉහළම මිල ගණන් වාර්තා විය.** 2010 වසරේ කොළඹ තේ වෙන්දේසියේ සියලුම තේ වර්ගවල වාර්ෂික සාමාන්‍ය මිල 2009 වාර්තා වූ කිලෝ ග්‍රෑමයකට රුපියල් 361 සිට 2010 වසරේදී කිලෝ ග්‍රෑමයකට 372 ක් දක්වා සියයට 3 කින් ඉහළ ගිය අතර, සාමාන්‍ය වාර්ෂික අපනයන මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 494 ක් දක්වා සියයට 5 කින් වර්ධනය විය. 2010 වසරේදී තේ මිල ගණන් ඉහළයාම කෙරෙහි වැඩි වශයෙන්ම හේතු වූයේ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තේ සඳහා ඉහළ යමින් පැවැති ඉල්ලුමයි. ලෝක කළු තේ සැපයුමේ පැවැති හිඟය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ කළු තේ සඳහා අධි මිලක් වාර්තා විය.

**2010 වසරේ රබර් නිෂ්පාදනය පසුගිය වසරට සාපේක්ෂව කිලෝ ග්‍රෑම් මිලියන 153 ක් දක්වා සියයට 12 ක වර්ධනයක් අත් කර ගන්නා ලදී.** වසරේ දෙවන සහ සිව්වන කාර්තුවලදී අධික වර්ෂාපතනයක් පැවතිය ද වසර මුළුල්ලේම සියලුම රබර් ප්‍රභේද සඳහා පැවැති ආකර්ෂණීය මිල ගණන් රබර් නිෂ්පාදනය නොකඩවා වර්ධනය වීමට වැඩි වශයෙන් බලපාන ලදී. මෙයට අමතරව රටේ මුළු රබර් ඉඩම් ප්‍රමාණයෙන් සියයට 54 කට දායකත්වය සපයන, 127,200 ක් පමණ වන කුඩා රබර් වතු හිමියන්ගෙන් සමන්විත කුඩා රබර් වතු අංශයෙහි පැවැති වර්ධනය, ඉහළ ගිය ස්වාභාවික රබර් මිල සඳහා කුඩා වතු හිමියන් දැක්වූ ඉක්මන් ප්‍රතිචාරය පෙන්නුම් කරන ලදී. තවද, කිරි කපන ලද රබර් ඉඩම් ප්‍රමාණයේ මෑතකාලීන ඉහළ යාම ද නිෂ්පාදනයේ වර්ධනය කෙරෙහි දායක විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2010 වසරේදී රබර් වගාවෙහි ජාතික ඵලදායිතාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,607 ක් දක්වා සියයට 11.8 කින් වර්ධනය විය. රබර් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම නිසා පොහොර, වැඩි දියුණු කළ කිරි නිස්සාරණ ශිල්පීය ක්‍රම සහ වැහි ආවරණ වැනි මනා කෘෂිකාර්මික භාවිතාවන් සඳහා වගාකරුවන් පෙළඹීම රබර් නිෂ්පාදනයේ වර්ධනයට හේතු විය. මෙම වර්ධනය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ රබර් පර්යේෂණ ආයතනය වැනි අදාළ අධිකාරීන්ගේ වැඩි දියුණු වූ ව්‍යාප්ති සේවාවන්වල අනුබලය ද ලැබුණි.

**2010 වසරේ දී සියලු රබර් ප්‍රභේදවල සාමාන්‍ය මිල ගණන් ඉතා ඉහළ මට්ටමක පැවතුණි.** 2009 වසරට සාපේක්ෂව 2010 වසරේදී ආර්.එස්.එස්. නො. 1 රබර් ප්‍රභේදයෙහි වාර්ෂික සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 403 ක් දක්වා සියයට 91 කින් ඉහළ ගිය අතර, ක්‍රේප් රබර් නො.1 ප්‍රභේදයෙහි වාර්ෂික සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයකට

**2.3 සංඛ්‍යා සටහන** **ප්‍රධාන කෘෂි බෝගවල උපනතීන්**

| අයිතමය | ඒකකය | 2009 (අ) | 2010 (ආ) |
|---|---|---|---|
| 1. තේ | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 291.0 | 329.0 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 222 | 222 |
| 1.3 දළු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 192 | 190 |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රුපියල්/කි.ග්‍රෑ. | 269.01 | 313.17 |
| 1.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය | රුපියල්/කි.ග්‍රෑ. | 360.85 | 371.54 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 470.11 | 494.39 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,126 | 1,274 |
| 1.7 අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 12 | 3 |
| 1.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.7 | 1.6 |
| 2. රබර් | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 136.9 | 153.0 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 124 | 126 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 95 | 95 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රුපියල්/කි.ග්‍රෑ. | 115.50 | 119.83 |
| 2.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.නො.1) | රුපියල්/කි.ග්‍රෑ. | 211.65 | 403.02 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 202.23 | 373.87 |
| 2.6 නැවත වගා කිරීම (උ) | හෙක්ටයාර | 1,002 | 1,493 |
| 2.7 අළුතින් වගා කිරීම (උ) | හෙක්ටයාර | 715 | 1,537 |
| 2.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.5 | 1.0 |
| 3. පොල් | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 2,853 | 2,317 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 395 | 395 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 9.53 | 11.27 |
| 3.4 සාමාන්‍ය මිල | | | |
| - නිෂ්පාදන මිල | ගෙඩියක් රුපියල් | 18.28 | 23.82 |
| - අපනයන (නැ.වි.ස.) (ඌ) | ගෙඩියක් රුපියල් | 18.23 | 25.67 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (එ) | හෙක්ටයාර | 3,545 | 2,684 |
| 3.6 අළුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 3,998 | 2,920 |
| 3.7 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.4 | 1.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2003 දී පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කර ඇත.
(උ) රබර්සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(ඌ) ප්‍රධාන පොල් නිෂ්පාදන තුන සඳහා පමණි.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය
වැව්ලි සමාගම්
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් 453 ක් දක්වා සියයට 113 කින් වර්ධනය විය. මේ අතර, ස්වාභාවික රබර් දේශීය පරිභෝජනය 2009 වසරේ පැවැති මෙට්‍රික් ටොන් 84,941 ක සිට 2010 වසරේදී මෙට්‍රික් ටොන් 107,225 ක් දක්වා (සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 70 ක්) ඉහළ යෑමට රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වර්ධනය හේතු විය. තායිලන්තය වැනි ප්‍රධාන රබර් නිෂ්පාදන රටවල් වල පැවැති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ස්වාභාවික රබර් සැපයුමෙහි ඇති වූ සැළකිය යුතු හිඟය සමග ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේදී ස්වභාවික රබර් සඳහා පැවැති ඉතා ඉහළ ඉල්ලුම සහ ඉහළ ගිය ඛනිජ තෙල් මිල ගණන්වල බලපෑම ස්වාභාවික රබර් මිල ගණන් ඉහළයාම කෙරෙහි වැඩි වශයෙන් හේතු විය.

**2010 වසරේ දී පොල් නිෂ්පාදනයෙහි තියුණු පසුබෑමක් පෙන්නුම් කරමින්, සමස්ත පොල් නිෂ්පාදනය පොල් ගෙඩි මිලියන 2,317 ක් දක්වා සියයට 19 කින් පහත වැටුණි.** පොල් වගා කරන ප්‍රධාන ප්‍රදේශවල 2009 වසරේ පැවැති අඩු වර්ෂාපතනයේ පසු බලපෑම පොල් නිෂ්පාදනය පහළ යාමට වැඩි වශයෙන් හේතු විය. 2010 වසරේ හතරවන වන කාර්තුව තුළදී පොල් නිෂ්පාදනය විශාල ලෙස අඩුවූ අතර, 2009 වසරේ එම කාල පරිච්ඡේදයට සාපේක්ෂව පොල් නිෂ්පාදනය පොල් ගෙඩි මිලියන 429 ක් දක්වා සියයට 32 කින් අඩු විය. මෑත වර්ෂවලදී පොල් වගාව සඳහා පොහොර භාවිතය අඩු වීමක් පෙන්නුම් කරන අතර, විශේෂයෙන්ම එය රටේ සමස්ත පොල් වගා බිම්වලින් සියයට 80 ක් පමණ නියෝජනය කරන කුඩා පොල් වතු වගා අංශයෙහි දැක ගත හැකි විය. 2010 වසරේ පොල් ත්‍රිකෝණයට අයත් කුරුණෑගල, ගම්පහ සහ පුත්තලම දිස්ත්‍රික්ක අතුරින් පොල් නිෂ්පාදනයේ සියයට 34 ක් වන වැඩිම පසුබෑම පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර, 2009 වසරේ අඩුම වර්ෂාපතනය ද පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. තවද, 2010 වසරේ දී කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්කවල මුළු පොල් නිෂ්පාදනය ද සියයට 24 කින් පහත වැටුණි. තවද, රටේ සමස්ත පොල් නිෂ්පාදනය අඩුවීම කෙරෙහි වතු අංශයේ සහ කුඩා පොල් වතු හිමියන්ගේ බොහොමයක් පොල් ඉඩම්වල මතුපිට පාංශු ඛාදනය, අඩු මට්ටමක පවතින පොහොර භාවිතය, රෝග පැතිරීම ආදියෙන් නිෂ්පාදන ඵලදාව පහත වැටීම සහ වෙනත් විකල්ප අරමුණු සඳහා පොල් ඉඩම් කැබලි කිරීම ද බලපා තිබේ.

**2010 වසරේ පොල් නිෂ්පාදනය පහළ යාම හේතුවෙන් ගෘහස්ත පරිභෝජනය සහ කර්මාන්ත සඳහා අවශ්‍ය පොල් ප්‍රමාණයේ දැඩි හිඟයක් පැවැති අතර පොල් මිල ගණන් පෙර නොවූ විරූ පරිදි ඉහළ යන ලදී.** 2010 වසරේ දී පොල් තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 65,130 ක් දක්වා සියයට 14 කින් පහත වැටුණි.

කෙසේ වෙතත්, කෑම පිසීමට භාවිතා කරන තෙල් ආනයනයන් මත පැවති ඉහළ තීරු බදු අනුපාතයන් හා ජාත්‍යන්තර වෙළෙඳපොළවල මෙම තෙල් සඳහා නොකඩවා ඉහළ යමින් පැවති මිල ගණන්වල බලපෑම හේතුවෙන්, පාම් තෙල් ආනයනයන් අඩු විය. මෙය පොල් සඳහා පොල්තෙල් මෝල් හිමියන්ගෙන් ඉහළ ඉල්ලුමක් පැවතීමට බොහෝ දුරට හේතු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2010 වසරේ දී, කොළඹ පොල් වෙන්දේසියේ පොල් ගෙඩියක් සඳහා වූ සාමාන්‍ය මිල 2009 දෙසැම්බර් පැවති රු. 23.50 සිට 2010 දෙසැම්බර් මස දී රුපියල් 41 ක් දක්වා ඉහළ ගිය අතර, මේ තත්ත්වය යටතේ තවදුරටත් මිල ගණන් ඉහළ යාම පාලනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට රජයට සිදු විය. ඒ අනුව, කෑම පිසීමට භාවිතා කරන තෙල් ආනයනය සඳහා වන තීරු බදු 2010 වසරේ නොවැම්බර් මස සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 15 ක් දක්වා අඩු කළ අතර, පොල් ගෙඩි අපනයනය කිරීමේදී අයකරනු ලබන සෙස් බද්ද පොල් ගෙඩියකට රුපියල් 2 සිට රුපියල් 30 දක්වා ඉහළ නංවනු ලැබිණි. එසේම, පොහොර සහන වැඩ පිළිවෙල යටතේ පොල් වතු හිමියන් සඳහා ඔවුන්ගේ පොල් වගා බිම් ප්‍රමාණය සැළකිල්ලට නොගෙන පොහොර ලබා දීමට ද රජය තීරණය කරන ලදී.

**2010 වසරේ, අපනයන කෘෂි බෝග බොහොමයක නිෂ්පාදනය යහපත් මට්ටමක පැවතුණි.** කරාබු නැටි නිෂ්පාදනය සියයට 215 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ගම්මිරිස් නිෂ්පාදනය සියයට 10 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2010 වසරේ කරාබු නැටි නිෂ්පාදනය මෙතෙක් වාර්තා කළ ඉහළම නිෂ්පාදන මට්ටම අත් කර ගත් අතර, එයට හේතු වූයේ 2009 වසරේ මල් පූදින සමයේදී පැවැති හිතකර කාලගුණික තත්ත්වයන්ගේ බලපෑමයි. ප්‍රධාන ගම්මිරිස් වගා කරන දිස්ත්‍රික්කවල 2009 වසරේ ජූලි මාසයේ සිට පැවැති අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ගම්මිරිස් ප්‍රධාන අස්වනු කාලසීමාව 2009 ජූලි මස සිට 2010 වසරේ ජනවාරි සහ පෙබරවාරි තෙක් පමාවීම 2010 වසරේ ගම්මිරිස් නිෂ්පාදනය ඉහළ යාමට හේතු විය. එසේම, 2010 වසරේදී සියයට 19 කින් ඉහළ ගිය ගොවිපල මිල ගණන් හා සියයට 24 කින් ඉහළ ගිය වෙන්දේසි මිල ගණන්, 2010 වසරේ ගම්මිරිස් නිෂ්පාදනයේ වර්ධනයට උපකාරී විය. මේ අතර, ඉහළ ගිය ගොවිපල මිල සහ වෙන්දේසි මිල ගණන්වල බලපෑම හේතුවෙන් කුරුඳු නිෂ්පාදනය ද සියයට 4 කින් වර්ධනය විය. විශේෂයෙන්ම කුරුඳු තෙල් අපනයන 2009 වසරේ දී පැවැති මෙට්‍රික් ටොන් 16.8 සිට 2010 වසරේ දී මෙට්‍රික් ටොන් 26 ක් දක්වා ඉහළ යන ලදී. තවද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිය ශිල්පීය සේවාවන් සහ වගා සහන මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල අපනයන බෝග ව්‍යාප්ත කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් වසර තුළදී විසින් ක්‍රියාවට නංවන ලදී.

### දේශීය කෘෂිකර්මය

**2009 වසර හා සසඳන කල 2010 වසරේදී සමස්ත වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.3 ක් දක්වා සියයට 17.8 කින් වර්ධනය විය.** 2009/10 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.6 ක් දක්වා සියයට 10 කින් වර්ධනය වූ අතර, 2010 යල

**2.4 සංඛ්‍යා සටහන**


**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 2009 (අ) | | | 2010 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද බිම් ප්‍රමාණය දළ වශයෙන් | හෙක්ටයාර දහස් | 632 | 345 | 978 | 646 | 419 | 1,065 |
| අස්වැන්න නෙලා ගත් දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 605 | 338 | 943 | 643 | 416 | 1,060 |
| අස්වැන්න කපා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 539 | 303 | 842 | 574 | 376 | 950 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 2,384 | 1,268 | 3,652 | 2,630 | 1,671 | 4,301 |
| | බුසල් දහස් | 114,241 | 60,763 | 175,004 | 126,029 | 80,074 | 206,103 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,421 | 4,187 | 4,336 | 4,583 | 4,444 | 4,528 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් මිලියන | 1,158 | 760 | 1,918 | 1,402 | 1,139 | 2,541 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 52 | - | - | 126 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 76 | - | - | 185 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත පදනම් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.2 රූප සටහන** **සහල් : සැපයුම සහ ඉල්ලුම**




කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.6 ක් දක්වා සියයට 31.8 කින් වර්ධනය විය. 2010 වසරේ වී නිෂ්පාදනය ඉහළයාම කෙරෙහි උතුරු හා නැගෙනහිර පළාත්වල වී වගාකරන බිම් ප්‍රමාණය ඉහළයාම, ප්‍රමාණවත්ව ලැබුණු වර්ෂාපතනය සහ වගාව සඳහා නියමිත අවස්ථාවේදී ජල සැපයුම මෙන්ම රාජ්‍ය කෘෂිකාර්මික ප්‍රතිපත්තිය යටතේ පුරන් කුඹුරු අස්වැද්දීම හේතු විය. මේ අතර, රජයේ පොහොර සහන වැඩ පිළිවෙල සහ රජයේ වී මිලදී ගැනීමේ වැඩ පිළිවෙල නොකඩවා ක්‍රියාත්මකවීම 2010 වසරේ වී නිෂ්පාදනයේ ඉහළ වර්ධනයක් ලබා ගැනීමට තවදුරටත් උපකාරී විය. 2010 වසරේ දෙකන්නය තුළම වී නිෂ්පාදනය ඉහළ යාම 2009 වසරට සාපේක්ෂව 2010 වසරේ වී වල සාමාන්‍ය ගොවිපොළ මිල පහළයාම කෙරෙහි බලපෑ නමුදු, වී මිලදී ගැනීමේ වැඩ සටහන හරහා රජය විසින් සිදුකරනු ලැබූ මැදිහත්වීම වී මිල ගණන් ස්ථායීව පවත්වා ගැනීමට හේතු විය. මහ සහ යල යන දෙකන්නයේදීම රජය නාඩු සහ සම්බා වී කිලෝවක් පිළිවෙලින් රුපියල් 28 සහ රුපියල් 30 බැගින් මෙට්‍රික් ටොන් 182,000 ක් මිලදී ගන්නා ලදී. තවද, 2009 වසරේදී සහල් හිඟයක් ඇතිවුවහොත් එයට මුහුණදීම සඳහා ආනයනය කරනු ලැබූ මෙට්‍රික් ටොන් 125,780 ක සහල් තොගයක්ද 2010 වසරෙහි වෙළෙඳපොළ තුළ දැකගත හැකි විය.

**2010 වසර තුළ දී අනෙකුත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී.** 2010 වසරේදී බඩ ඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 161,694 ක් දක්වා සියයට 25 කින් ඉහළ යන ලදී. ඉදිරි වෙළෙඳ ගිවිසුම් හරහා සුරක්ෂිත වෙළෙඳපොළක් සහ මිල ගණන් පැවතීම, බඩ ඉරිඟු ආනයනය මත අය කරන සෙස් බද්ද ඉහළ දැමීම සහ බඩ ඉරිඟු ආනයනය සඳහා බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය කිරීම මගින් දේශීය බඩ ඉරිඟු වගාකරුවන් සුරක්ෂිත කිරීමට රජයේ පැවති කැපවීම බඩ ඉරිඟු නිෂ්පාදනය වැඩිවීමට හේතු විය. මේ අතර, රතු ළූණු, සෝයා බෝංචි, අමු මිරිස් සහ උඳු පිළිවෙලින් සියයට 34 කින් (මෙට්‍රික් ටොන් 61,811), සියයට 97 කින් (මෙට්‍රික් ටොන් 7,521), සියයට 6 කින් (මෙට්‍රික් ටොන් 49,003) සහ සියයට 41 කින් (මෙට්‍රික් ටොන් 9,991) වර්ධනය විය. කෙසේ වෙතත්, අර්තාපල්, ලොකු ළූණු සහ කව්පි නිෂ්පාදනය පිළිවෙලින් සියයට 16 කින් (මෙට්‍රික් ටොන් 51,933), සියයට 28 කින් (මෙට්‍රික් ටොන් 58,930) සහ සියයට 14 කින් (මෙට්‍රික් ටොන් 11,609) පහත වැටුණි. රතු ළූණු නිෂ්පාදනය ඉහළ යාම කෙරෙහි පුත්තලම හා යාපනය දිස්ත්‍රික්කවල රතු ළූණු වගා කටයුතුවල පැවැති සැලකිය යුතු වර්ධනය වැඩි වශයෙන් බලපෑ අතර, ලොකු ළූණු නිෂ්පාදනය සැළකිය යුතු ප්‍රමාණයකින් පහත වැටීම සඳහා යල කන්නයෙහි පැවැති අධික වර්ෂාව හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ ලොකු ළූණු ගොවීන් වී වගාවට යොමුවීම වැඩි වශයෙන් හේතු විය. සෝයා ආශ්‍රිත නිෂ්පාදකයන්ගෙන් මෑත කාලයේ මතුවෙමින් පවතින ඉහළ ඉල්ලුම හේතුවෙන් සෝයා බෝංචි සඳහා ලාභදායී මිල ගණන් පැවතීම සෝයා බෝංචි නිෂ්පාදනය ඉහළයාම සඳහා බලපා ඇත. සැබවින්ම, 2010 වසරේ රජය ද වී මිලදී ගැනීමේ මණ්ඩලය හරහා මැදිහත් වෙමින් අතිරික්ත සෝයා බෝංචි අස්වැන්න මිලදී ගැනීම, සෝයා බෝංචි මිල ගණන් ස්ථායී කිරීමට උපකාරී විය. 2010 වසරේ අර්තාපල් නිෂ්පාදනය පහළ යාම කෙරෙහි වගා කටයුතු ආරම්භයේ දී උසස් තත්ත්වයේ අර්තාපල් බීජවල පැවැති හිඟය සහ ආනයනය කරන අර්තාපල් බීජවල ඉහළ මිල ගණන් බලපාන ලදී.

**2010 වසරේදී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 31,335 ක් දක්වා සියයට 2.6 කින් සුළු වශයෙන් පහත වැටුණි.** සීනි නිෂ්පාදනය පහළ යාම කෙරෙහි 2010 වසරේදී උක් ගොවීන් වී සහ කෙසෙල් වැනි අනෙකුත් බෝගයන් වගා කිරීම සඳහා යොමුවීම හේතුවෙන් උක් වගා කළ බිම් ප්‍රමාණය සියයට 2 කින් පමණ අඩුවීම බලපාන ලදී. වර්තමාන දේශීය සීනි නිෂ්පාදනය ප්‍රමාණවත් වන්නේ රටේ වාර්ෂික සීනි අවශ්‍යතාවයෙන් සියයට 6 ක් සඳහා පමණි. වර්තමානයේ දී නිෂ්පාදන කටයුතු අතහැර දමා ඇති හිඟුරාණ සීනි කර්මාන්තශාලාවෙහි නිෂ්පාදන කටයුතු යළි ආරම්භ කිරීම සඳහා උක් වගා කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. කර්මාන්තශාලාවේ වාණිජ නිෂ්පාදන කටයුතු 2012 වසරේදී ආරම්භවීමට නියමිතව ඇත. උක් වගා කරන්නන්

ඉතා ඉහළ ඵලදාවක් ලැබෙන උක් දඬු වගා කිරීම සහ පොහොර යෙදීම වැනි මනා කෘෂිකාර්මික භාවිතාවන් අනුගමනය කිරීම අවශ්‍ය වන අතර, එය ඵලදායිතාවය ඉහළ දැමීමට හේතුවනු ඇත. 2010 වසරේදී උක් පර්යේෂණ ආයතනය විසින් ඉතා ඉහළ ඵලදාවක් ලබාදෙන උක් ප්‍රභේද 3 ක් හඳුන්වාදෙන ලදී.

## ධීවර

**2010 වසරේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 381,630 ක් දක්වා සියයට 12 කින් වර්ධනය විය.** මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 87 ක දායකත්වයක් ලබා දුන් අතර, සෙසු කොටස මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන අංශය තුළින් ලැබිණි. වසර තුළදී මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය සියයට 13 කින් වර්ධනය වූ අතර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 10 කින් වර්ධනය විය. ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය 2010 වසරේ දී අපේක්ෂිත නිෂ්පාදන මට්ටමට වඩා අඩු වර්ධනයක් අත් කර ගැනීමට හේතු වූයේ ගැඹුරු මුහුදේ පැවැති අයහපත් කාළගුණික තත්ත්වයන්හි බලපෑම සහ බහු දින ධීවර යාත්‍රා ප්‍රමාණය ඉලක්කගත පරිදි වැඩි නොවීමයි. කෙසේ වෙතත්, උතුරු සහ නැගෙනහිර පළාත්වල ධීවර කටයුතු සැළකිය යුතු ලෙසින් ඉහළයාම 2010 වසරේ දී මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළයාම කෙරෙහි වැඩි වශයෙන් බලපා තිබේ. උතුරු සහ නැගෙනහිර පළාතේ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය 2010 වසරේ දී මෙට්‍රික් ටොන් 125,840 ක් දක්වා සියයට 40 කින් වර්ධනය විය. "නැගෙනහිර නවෝදය" සහ "උතුරු වසන්තය" වැඩ සටහන් යටතේ බෝට්ටු සහ ධීවර ආම්පන්න බෙදාහැරීම මෙන්ම ධීවරයන්ගේ කුසලතා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වූ බොහෝ ධීවර වැඩසටහන් මෙම පළාත්වල ධීවර කටයුතු වේගවත්ව යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී විය. ප්‍රජා සහභාගීත්වය සහිත ජලාශ කළමනාකරණය, ප්‍රජා මූලික සුළු පරිමාණ මත්ස්‍ය පැටව් අභිජනන ගොවිපලවල් පිහිටුවීම, මත්ස්‍ය පැටව් නිෂ්පාදනයේ ඉහළයාම මෙන්ම මසක් වයසැති මත්ස්‍ය පැටව් නොමිලයේ බෙදාහැරීම වැනි කාර්යයන් අභ්‍යන්තර ජලාශ සහ ජලජීවී මත්ස්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට උපකාරී වී ඇත. සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය වී තිබියදීත් 2010 වසරේ දී බොහොමයක් මත්ස්‍ය වර්ගවල සාමාන්‍ය මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම කෙරෙහි අහිතකර කාළගුණ තත්ත්වයන් හේතුවෙන් දකුණු, බටහිර සහ වයඹ පළාත්වල අපේක්ෂිත මත්ස්‍ය නිෂ්පාදනය නොලැබීම සහ රට තුළ මත්ස්‍ය පරිභෝජනයේ ඉහළ යාම වැඩි වශයෙන් බලපා තිබේ.

**2.5 සංඛ්‍යා සටහන — මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන් දහස්

| උප අංශය | 2009 (අ) | 2010 (ආ) |
|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 293 | 330 |
| ජල ජීවී සහ මිරිදිය මසුන් | 47 | 51 |
| **එකතුව** | 340 | 381 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදුබඩ සහ ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලය : ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය

## පශු සම්පත්

**2010 වසරේ දී සමස්ත කිරි නිෂ්පාදනය ලීටර මිලියන 247 ක් දක්වා සියයට 6 කින් පමණ වර්ධනය විය.** රටේ ප්‍රධාන කිරි නිෂ්පාදන සැකසුම්කරුවන් විසින් එකතු කළ කිරි ලීටර ප්‍රමාණය 2009 වසරේදී පැවැති ලීටර මිලියන 125.4 සිට 2010 වසරේ දී ලීටර් මිලියන 137.6 ක් දක්වා සියයට 10 කින් වර්ධනය වීමට රට තුළ කිරි එකතු කරන මධ්‍යස්ථාන ප්‍රමාණය 2009 වසරේ පැවැති 2,673 සිට 2010 වසරේ දී 2,895 දක්වා ඉහළ යෑම උපකාරී විය. තවද, ප්‍රධාන කිරි නිෂ්පාදන සැකසුම්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන ශීතාගාර සංඛ්‍යාව ඉහළයාම, රට තුළ එකතු කළ වටිනාකම් සහිත කිරි නිෂ්පාදනය කරනු ලබන ව්‍යාපාර සංඛ්‍යාව ඉහළ යාම, රාජ්‍ය සහ පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන දියර කිරි අලෙවි සැල් සංඛ්‍යාවෙහි වැඩිවීම මගින් මෑතකාලයේ කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඇතිවෙමින් පවතින ප්‍රගතිය පෙන්නුම් කරයි. ඒ අනුව, 2009 වසරේ සමස්ත ජාතික කිරි අවශ්‍යතාවයෙන් සියයට 28 ක්ව පැවැති දේශීය කිරි නිෂ්පාදනය 2010 වසරේ දී සියයට 30 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2020 වසර වනවිට රටෙහි සමස්ත කිරි අවශ්‍යතාවය මුළුමනින්ම දේශීයව සපුරාගැනීම රජයේ ඉලක්කය වී තිබේ. 2010 වසරේ දී කිරි ලීටරයක් සඳහා සාමාන්‍ය නිෂ්පාදන මිල ලීටරයකට රුපියල් 32.50 ක් වූ අතර, (මේදය/ඝන මේද කොටස් = 3.8/8.3) එය 2009 වසර තුළ දී ලීටරයට රුපියල් 29.50 ක් විය. මෙම තත්ත්වය කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය දිරිමත් කිරීමට උපකාරී විය.

**2010 වසරේදී කුකුළු මස් නිෂ්පාදනය සියයට 5 කින් පමණ ඉහළ ගිය අතර, බිත්තර නිෂ්පාදනය සියයට 0.2 ක ඉතා සුළු අඩුවීමක් පෙන්නුම් කරන ලදී.** බඩ ඉරිඟු ආනයනය සඳහා සීමාවන් පවතින අතරම 2009 වසරේ යල කන්නයේ දී දේශීය බඩ ඉරිඟු සැපයුමේ ඇති වූ හිගය බඩ ඉරිඟු මිල ගණන් ඉහළ යාමට හේතුවිය. මෙය සත්ත්ව ආහාර මිල ගණන්

**2.6 සංඛ්‍යා සටහන**

**පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

| | උප අංශය | 2009 (අ) | 2010 (ආ) |
|---|---|---|---|
| 1. | ජාතික ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.5 | 1.6 |
| | එළ ගවයන් | 1.1 | 1.2 |
| | මී ගවයන් | 0.4 | 0.4 |
| 2. | ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 233.4 | 247.6 |
| | එළ කිරි | 184.1 | 191.9 |
| | මී කිරි | 49.3 | 55.6 |
| 3. | කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් මිලියන) | 23.3 | 17.8 |
| 4. | නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 29.53 | 32.48 |
| 5. | ජාතික බිත්තර නිෂ්පාදනය (මිලියන) | 1,142.2 | 1,139.9 |
| 6. | ජාතික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 99.28 | 104.16 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ඉහළ යාමට හේතු වූ බැවින් කුකුල් මස් හා බිත්තර වල නිෂ්පාදන පිරිවැය ඒ සමගම ඉහළ යන ලදී. කුකුළු මස් සහ බිත්තර මිළ ගණන් සැළකිය යුතු ලෙස ඉහළ ගිය බැවින්, දේශීය කුකුළු මස් හා බිත්තර මිල ගණන් ස්ථායී කිරීම සඳහා බිත්තර මිලියන 10 ක් පමණ සහ කුකුළු මස් මෙට්‍රික් ටොන් 500 ක් “ලක් සතොස” මගින් 2010 දෙසැම්බර් උත්සව සමය තුළ දී හා 2011 ජනවාරි මාසය තුළ දී ආනයනය කරන ලදී.

### වන සම්පත්

**2010 අවසාන වනවිට ශ්‍රී ලංකාවේ සමස්ත වනගහනය හෙක්ටයාර 1,934,062 ක් ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබේ.** 2010 වසරේ දී හඳුනාගනු ලැබූ කඩොලාන කැලෑ ප්‍රමාණය හෙක්ටයාර් 15,545 ක් වූ අතර 2009 වසරේ දී එය හෙක්ටයාර් 8,815 ක් විය. වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් හෙක්ටයාර 873 ක නැවත වන වගාවන් සිදුකරන ලදී. තවද, ලෝක ආහාර වැඩසටහනේ ආධාරය ලබමින් 2009 වසරේ දී ආරම්භ කරන ලද නැවත වන වගා කිරීමේ වැඩසටහන යටතට අයත් කටයුතු 2010 වසරේ දී සාර්ථකව සිදුකරන ලදී. මෙම වැඩසටහන යටතේ අම්පාර, ත්‍රිකුණාමලය, වව්නියාව සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල ගෙවතු වගා සංවර්ධනය, ගොවි වන වගාබිම් කට්ටි සංවර්ධනය, ඇළ ඉවුරු වගා කිරීම හා වැව් පෝෂක ප්‍රදේශ පුනරුත්ථාපනය මෙන්ම නිසරු කඩොලාන කැලෑවන් පුනරුත්ථාපනය කිරීම සිදු කරන ලදී.

**“මහින්ද චින්තන ඉදිරි දැක්ම” තුළ දක්වා ඇති පරිදි රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ඉලක්ක කිහිපයක් කෙරෙහි යොමු වී ඇත.** ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව ළගාකර ගැනීම, ගොවීන් සඳහා ඉහළ හා තිරසාර ආදායමක් මෙන්ම ගොවීන්ට ලාභදායී මිලක් සහතික කිරීම, දේශීය සහ විදේශීය වෙළෙඳපොළවලට ප්‍රවිෂ්ඨවීම සඳහා ඇති බාධා ඉවත් කිරීම, ගොවිපළ යාන්ත්‍රීකරණය, වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම, ප්‍රවාහනයේදී සිදුවන නාස්තිය අවම කිරීම සහ පරිසර සංරක්ෂණය සහතික කිරීම, කාර්යක්ෂම ගොවිපල කළමණාකරණ ශිල්ප ක්‍රම හඳුන්වාදීම, වැඩි දියුණු කළ ජල කළමනාකරණය සහ ඉහළ ඵලදායිතාවයෙන් යුතු බීජ භාවිතා කිරීම මෙකී ඉලක්කයන්ට ඇතුළත් වේ. මෙම ප්‍රතිපත්තීන් අනුව යමින් රජය ඇතැම් උපාය මාර්ග හා වැඩසටහන් හඳුනාගෙන තිබේ. මේ යටතේ, ජාතික බෝගය ලෙස වී ප්‍රවර්ධනය කිරීම, අනෙකුත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනයන්හි ස්වයංපෝෂිත මට්ටමට පැමිණීම, එළවළු සහ පළතුරු බෝගයන්ගේ සම්පූර්ණ නිෂ්පාදන හැකියාව ලබා ගැනීම සහ සුරක්ෂිතව අසුරණ ලද එළවළු සහ පළතුරු අපනයනය කිරීම, විසිතුරු මල් වගාවන් සඳහා ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටුවීම, නිරෝගී සෞඛ්‍යය සඳහා ඔසු උයන් ඇති කිරීම, යෙදවුම් බෙදා හැරීමේ යාන්ත්‍රණයන් සවිමත් කිරීම, ගොවි ජනතාවට ආකර්ෂණීය කෘෂිකාර්මික ණය ලබාදීම, නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් අතර සම්බන්ධතාවය ඇති කිරීම, අතුරු බෝග සහ බහු බෝග වගාවන් හරහා බෝග විවිධාංගීකරණය, අඩු පිරිවැයක් සහිත දේශීය පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ස්වාභාවික පාන වර්ග ප්‍රවර්ධනය කිරීම යනාදිය මෙම උපාය මාර්ග හා වැඩසටහන් යටතට ඇතුළත් වේ.

**2010 වසරේදී, ශ්‍රී ලංකා තේවල නිෂ්පාදනවල නිෂ්පාදන ඵලදායිතාවය, ගුණාත්මකභාවය සහ එකතුකළ වටිනාකම ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් සිය කටයුතු මෙහෙයවනු ලැබිණ.** තේ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් වැවිලි සමාගම්වල සහ කුඩා තේ වතු හිමියන්ගේ නව වගා කිරීම්, නැවත වගාකිරීම්, පැළ සිටුවීම් දිරි ගැන් වූ අතර, කුඩා තේ වතු හිමියන් සඳහා ලබාදෙන පොහොර සහන වැඩපිළිවෙළ නොකඩවා ක්‍රියාත්මක විය. තේ නැවත වගාකිරීම් සහ නව වගා කිරීම් දිරිගැන්වීම සඳහා කුඩා තේ වගාකරුවන් සඳහා ලබාදෙන වගා සහනය හෙක්ටයාරයකට රුපියල් 50,000 කින් ඉහළ නංවන ලදී. මේ අතර, කුඩා තේ ඉඩම් පුනරුත්ථාපන වැඩපිළිවෙල යටතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් වසර තුළදී හෙක්ටයාර 1,972 ක තේ නැවත වගා කිරීමේ කටයුතු සිදු කරන ලදී. ශ්‍රී ලංකා

තේ ජාත්‍යන්තර වෙළෙඳපොළවල ප්‍රවර්ධනය කිරීම සඳහා 2010 නොවැම්බර් මස දී තේ මණ්ඩලය යටතේ තේ ප්‍රවර්ධනය සහ අලෙවිකරණය නමින් අරමුදලක් පිහිටවනු ලැබූ අතර, තේ අපනයන මත අයකරන කිලෝ ග්‍රෑමයකට රුපියල් 3.50 ක් වූ ගාස්තුවක් මගින් මෙයට අවශ්‍ය අරමුදල් රැස් කරගනු ඇත. ශ්‍රී ලංකා වෙළෙඳ සන්නාමයන් යටතේ එකතු කළ වටිනාකම වැඩි තේ අපනයනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා, තේ තොග අපනයන මත අය කරන සෙස් බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 4 සිට රුපියල් 10 දක්වා ඉහළ නංවන ලදී. ප්‍රාදේශීය වතු වැවිලි සමාගම් යටතේ විශාල වපසරියක පවතින තේ බිම් නැවත තේ වගා කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය පියවරයන්ද ගනු ලැබ ඇත.

**වසර තුළදී, පොල් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පොල් වගා අංශයෙහි සංවර්ධන කටයුතු නොකඩවා ක්‍රියාවට නැංවීය.** දකුණු පළාතෙන් මතු වූ පොල් වගාවට වැළඳෙන සුව කළ නොහැකි රෝගයක් වන "වැලිගම කොළ මැලවීමේ රෝගය" මගින් රටෙහි පොල් වගාව අනතුරට ලක්කර ඇත. මෙම රෝගයෙන් බලපෑමට ලක් වූ පොල් ගස් 18,109 ක් වසර තුළදී කපා ඉවත්කළ අතර රෝගවලට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද හඳුන්වාදීමේ පළමු පියවර ලෙස මෙම රෝගයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්ට පොල් පැළ බෙදාදීම සිදු කෙරුණි. කටුපොල් (Oil Palm) වගා කරන වතු වැවිලි සමාගම් සඳහා අනුබලයක් ලෙස පොල් පර්යේෂණ ආයතනය තුළ කටුපොල් පර්යේෂණ කටයුතු සඳහා නව අංශයක් ස්ථාපිත කරන ලදී. මෙමගින්, පිසීමට ගන්නා තෙල් සඳහා පවතින ඉල්ලුම සහ සැපයුම අතර පරතරය පියවීම සඳහා දේශීය වශයෙන් කටුපොල් වගා කිරීම දිරිමත් කෙරේ. පොල් වගා සහන වැඩ පිළිවෙළ සඳහා සුදුසුකම් ලැබීමට තිබිය යුතු අවම භූමි ප්‍රමාණය අක්කර භාගයේ සිට අක්කර කාල දක්වා අඩු කරන ලදී. එමෙන්ම, උතුරු සහ නැගෙනහිර දෙපළාතෙහි හඳුනාගත් අක්කර 70,000 ක පමණ පොල් වගා කටයුතු වර්ධනය කිරීමේ අරමුණින් කිලිනොච්චි ප්‍රදේශයෙහි බීජ පැළ තවානක් පිහිටුවීම සඳහා පියවර ගෙන ඇත. තවද, පොල් වගා ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සහතික කිරීම සඳහා රජය විසින් නව අමාත්‍යාංශයක් පිහිටුවන ලදී. එසේම, වර්තමාන පොල් නිෂ්පාදනය මැදි කාලීනව පොල් ගෙඩි මිලියන 3,500 ක් දක්වා ඉහළ නැංවීම සඳහා නව වගාවන් සහ නැවත වගාවන් සඳහා සහන ලබාදීම, අතුරු වගාවන් ප්‍රචලිත කිරීම සහ පොල් වගා ක්ෂේත්‍රයේ ඵලදායිතාවය ඉහළ නැංවීම වැනි විවිධ පියවරයන් ගෙන ඇත. ඉහත ඉලක්කයන් සපුරා ගැනිම සඳහා රජයේ බීජ ගොවිපල්වල බීජ පැළ නිෂ්පාදනය මිලියන 4 දක්වා වැඩි කිරීමට ද සැලසුම් කර ඇත. පොල් වගාව සහ පොල් නිෂ්පාදන පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා තවත් පියවරක් ලෙස "කප්රුක ගැමි සමාජ" ක්‍රමය හඳුන්වාදීම ද සිදු විය.

**රබර් නිෂ්පාදනය සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා රබර් පර්යේෂණ ආයතනය මගින් වසර තුළදී විවිධ ක්‍රියාමාර්ග දියත් කරන ලදී.** රටේ වර්තමාන රබර් වගාවේ ක්ලෝන සංයුතිය පිළිබඳව කරන ලද අධ්‍යයනයකින් පසු රෝගයන්ට ඔරොත්තු දීම සහ ඉහළ දැව ධාරිතාවයක් පැවතීම වැනි ද්විතීයීක ලක්ෂණයන්ගෙන් යුතු ඉහළ ඵලදාවක් ලැබෙන ක්ලෝන වගා කිරීමට රබර් පර්යේෂණ ආයතනය ක්‍රියාමාර්ග ගෙන ඇත. සම්ප්‍රදායික නොවන බිම්වල රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා වව්නියාව, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි රබර් වගා නියමු ව්‍යාපෘති ආරම්භ කල අතර, ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ රබර් වගාකරුවන්ට පහසුකම් සැපයීම සඳහා නව උප මධ්‍යස්ථානයක් මොණරාගල පිහිටුවන ලදී. ඒ අතරම, වසර තුළ දී ඵලදායී, සමීප සහ නොකඩවා ක්‍රියාත්මක වන ව්‍යාප්ති සේවාවන් පවත්වාගෙන යන ලදී. මොණරාගල, වව්නියාව සහ මුලතිව් වැනි දිස්ත්‍රික්කවල රබර් වගා කටයුතු ප්‍රවර්ධනය කරමින් රබර් නව වගාවන් සහ නැවත වගාවන් සඳහා ලබාදෙන සහන ඉහළ නංවන ලදී. ඉහළ එකතුකළ වටිනාකම් සහිත රබර් අපනයන දිරි ගැන්වීම සඳහා, අමු ස්වභාවික රබර් අපනයන මත අයකරන සෙස් බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 4 සිට රුපියල් 8 ක් දක්වා ඉහළ නංවන ලදී.

**2011 වසර සඳහා වූ අයවැය මගින් ගුණත්වයෙන් වැඩි බීජ හා පැළ සැපයුම ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දී ඇත.** රජය සතුව දැනට පවතින බීජ ගොවිපලවල් 19 ක් සහ කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථාන යටතේ පවතින ඌණ උපයෝජිත ඉඩම්, 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය - පෞද්ගලික හවුල් ක්‍රියාකාරීත්ව පදනම යටතේ ජාතික ප්‍රමුඛතාවයක් ලෙස සලකා සංවර්ධනය කිරීමට තුන් අවුරුදු බීජ වගා සංවර්ධන වැඩ පිළිවෙලක් ඇරඹීමට යෝජනා වී ඇත. තවද, ගම්පහ, අවිස්සාවේල්ල සහ කෑගල්ල දිස්ත්‍රික්කවල මල් වගාව හා විසිතුරු පැළ වගාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ ගුණත්වයෙන් යුතු මල් සහ විසිතුරු පැළ තවාන් පිහිටුවීම සඳහා විශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට ද යෝජනා වී ඇත.

**කෘෂිකර්මාන්තය ප්‍රචලිත කිරීම සඳහා 2007 දී හඳුන්වා දුන් "අපි වවමු - රට නගමු" ජාතික වැඩ සටහන සාර්ථකව තෙවන වසරටත් 2010 වසරේදී නොකඩවා ක්‍රියාත්මක විය.** 2009 වසර තුළදී වී වගා කළ පුරන් කුඹුරු අක්කර 75,752 ක ප්‍රමාණයට අමතරව 2010 වසර තුළදී තවත් පුරන් කුඹුරු අක්කර 18,511 ක් වගා කරන ලදී. 2010 වසර තුළදී ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් යටතේ ගෙවතු 375,000 ක් වැඩි දියුණු කෙරිණ. 2010 වසරේදී ප්‍රජා මූලික බීජ සංවර්ධන වැඩසටහන් යටතේ බඩ ඉරිඟු, රතු ළූණු, කව්පි සහ මිරිස් වැනි වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ කිලෝ ග්‍රෑම් 42,325 ක ප්‍රමාණයක් ගොවීන් අතර බෙදා දීම සිදු විය. ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු වගාවේ වත්මන් පසු අස්වනු හානිය සියයට 30 සිට 40 දක්වා වූ ඉහළ මට්ටමක පවතී. මෙම පසු අස්වනු හානිය අඩු කිරීම සඳහා සහන මිලක් යටතේ ප්ලාස්ටික් ඇසුරුම් 142,500 ක් ගොවීන්, වෙළෙඳුන් සහ එළවළු හා පළතුරු එකතු කරන්නන් අතරේ පසුගිය වසර තුන තුළ බෙදා දීමට කටයුතු කරන ලදී. මෙයට  2010 වසරේ දී බෙදා දුන් මෙබඳු ප්ලාස්ටික් ඇසුරුම් 20,700 ක් ද ඇතුළත් ය. තවද, කාබනික පොහොර සඳහා බල පැවැත්වූ ඉහළ ලාභදායී මිල සහ අදාළ ආයතන මගින් සිදු කරන ලද ව්‍යාප්ති වැඩ සටහන්වල ප්‍රතිඵලයක් ලෙස  2010 වසරේ දී කාබනික පොහොර නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වර්ධනය විය.

**රටෙහි දේශීය කෘෂිකර්ම අංශය වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක රජයේ ප්‍රතිපත්තිය අනුව යමින්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතට අයත්  ආයතන වසර තුළදී සිය වැඩසටහන් නොකඩවා පවත්වාගෙන යන ලදී.** පලිබෝධ සහ රෝගයන්ට ප්‍රතිරෝධී, හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 9 ක ඵලදායිතාවයක් ලබාදෙන බීජී 366 ප්‍රභේදය සහ හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 7 ක ඵලදායීත්වයක් ලබාදෙන එල්ඩී 408 යන වී ප්‍රභේද වී පර්යේෂණ ආයතනය විසින් වසර තුළදී හඳුන්වා දෙන ලදී. රසායනික පලිබෝධ පාලනය පිරිවැය අධික වන අතරම පරිසර  දූෂණයට ද හේතු වන හෙයින් පලිබෝධ පාලනයේදී පරිසර හිතකාමී සහ අමතර පිරිවැයක් අවශ්‍ය නොවන හොඳම පලිබෝධ පාලන විකල්පය වන්නේ රෝග හා පලිබෝධ ප්‍රතිරෝධී ප්‍රභේද වැඩි දියුණු කිරීමයි. මෙම වසරේ දී වෙනත් ක්ෂේත්‍ර බෝග අංශයෙහි වාර්තා වූ සැළකිය යුතු වර්ධනයක් වූයේ අර්තාපල් වගාවට වැළදෙන "පශ්චිම  අංගමාරයට" ප්‍රතිරෝධී "ගෝල්ඩන් ස්ටාර්" නම් නව අර්තාපල් ප්‍රභේදයක් නිකුත් කිරීමයි. තවද, උද්‍යාන බෝග වගා ක්ෂේත්‍රයේ, "ලංකා චෙරි" නමින් චෙරි කුලයේ නව තක්කාලි ප්‍රභේදයක් සහ "මිල්ලෑව වරණය" නමින් නව කෙසෙල් ප්‍රභේදයක් වාණිජ වගා කටයුතු සඳහා හඳුන්වා දෙන ලදී. එසේම 2010 වසරේ කෘෂි කාර්මාන්තයේ ප්‍රවර්ධනයට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කළ බීජ නිෂ්පාදන වැඩ සටහන්වල ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. ඒ අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ බීජ වී නිෂ්පාදනය 2009 දී පැවති මෙට්‍රික් ටොන් 2900 සිට 2010 වසරේ දී මෙට්‍රික් ටොන් 4,476 ක් දක්වා ඉහළ නංවන ලදී.

**කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ ප්‍රමුඛ අංගයක් වේ.** ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන් ඉහළයාම හේතුවෙන් 2009 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන  165.67 ක් වූ (මෙට්‍රික් ටොන් 65,246) කිරි සහ කිරි නිෂ්පාදන ආනයන වියදම 2010 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 258.75 ක් දක්වා (මෙට්‍රික් ටොන් 76,010) වර්ධනය විය. මෙම පසුබිම යටතේ, දේශීය කිරි නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා 2010 ජූනි මස සිට ක්‍රියාත්මක වන පරිදි කිරි ලීටරයක නිෂ්පාදන මිල රුපියල් 33.00 දක්වා රුපියල් 3.00 කින් ඉහළ නංවන ලදී. තවද, රටෙහි කිරි එකතු කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම සඳහා 2011 වර්ෂයේ, මාර්තු මාසයේදී මිල්කෝ සමාගම විසින් කිරි ලීටරයක නිෂ්පාදන මිල රුපියල් 50 දක්වා ඉහළ නංවන ලදී. එමෙන්ම සතුන් හඳුනා ගැනීම, සත්ත්ව සුභසාධනය සහ සතුන් ප්‍රවාහනය යනාදී ක්ෂේත්‍රවල පවතින ගැටළු සම්බන්ධ කටයුතු පහසු කිරීම සඳහා "1958 අංක 29 දරන සත්ත්ව පනත" සඳහා සංශෝධන කිහිපයක් 2010 වසරේ දී සිදුකරන ලදී. මීට අමතරව කිරි නිෂ්පාදනය ශක්තිමත් කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අනුව යමින් අභිජනනය සඳහා ආනයනය කෙරෙන කිරි ගවයින් සහ කිරි නිෂ්පාදනයට අදාල වන උපකරණ ආනයන මත පනවා තිබූ තීරු බදු ඉවත් කරන ලදී. ගැටුම්වලට මැදි වූ ප්‍රදේශවල අයිතිකරුවන් නොමැති ගවයින් රැස් කිරීම සහ එම සතුන් එම  ප්‍රදේශයන්හි ගොවීන්ට බෙදා දීම, කිරි ගම්මාන ව්‍යාප්ත කිරීම, කෘත්‍රිම සිංචනය මගින් සත්ත්ව අභිජනන කටයුතු ඉහළ නැංවීම සහ තෘණ භූමි සංවර්ධන වැඩසටහන්  ක්‍රියාත්මක වීම රටේ කිරි ගව ගහනය වැඩි වීමට හේතු විය. 2010 වසර තුළදී, කෘත්‍රිම සිංචනය ආශ්‍රයෙන් එළ දෙනුන් සහ මී දෙනුන් 190,771 ක් අභිජනනය කළ අතර, මෙය 2009 වසරට සාපේක්ෂව සියයට 10 ක වැඩිවීමකි.  එසේම රටේ සමස්ත එළ ගවයින් සංඛ්‍යාව 2009 හි පැවති 1,136,860 සිට 2010 වසරේදී 1,169,670 දක්වා සියයට 3 කින් වැඩි විය.

**ශ්‍රී ලංකාවේ කෘෂිකර්මික අංශය වේගවත්ව වර්ධනය කිරීම සඳහා අංශ කිහිපයක් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.** අනාගතයේදී, වෙළෙඳ ගිවිසුම් හරහා ලෝක වෙළෙඳපොළවල් සමග ශ්‍රී ලංකාව තවදුරටත් ඒකාබද්ධ වීම අපේක්ෂා කළහැකි බැවින්, කෘෂි අංශයේ තරඟකාරිත්වය වැඩි කිරීම සඳහා දේශීය සහ අපනයන කෘෂිකර්මය යන දෙඅංශයෙහිම ඵලදායිතාවය සහ එකතු කළ අගය වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, දියුණු කෘෂිකාර්මික සහ සැකසුම් ක්‍රම වැඩි වශයෙන් භාවිතා කිරීම, සුදුසු අවස්ථාවලදී ප්‍රාග්ධන සූක්ෂම ක්‍රම වැඩිපුර භාවිතය, පසු අස්වනු හානිය අවම කිරීම සහ අවශ්‍ය තාක්ෂණික සේවාවන් සැපයීම ආදිය වැඩි දියුණු කළ හැකි ක්ෂේත්‍රයන් ලෙස පෙන්වා දිය හැක. තවද, මහා පරිමාණ ගොවිපළ සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම සඳහා ක්‍රියාමාර්ග හඳුන්වාදීම අවශ්‍ය අතර, එය රටේ ආහාර සැකසුම් කර්මාන්ත සඳහා අවශ්‍ය ආයෝජන ද දිරිගන්වනු ඇත.

### කාර්මික අංශය

**පෙර වසරේ දී සියයට 4.2 කින් වර්ධනය වූ කාර්මික අංශය 2010 වසරේ දී සියයට 8.4 ක ඉහළම ආංශික වර්ධනය වාර්තා කරන ලදී.** කාර්මික අංශයෙහි පෙන්වූ යහපත් ක්‍රියාකාරීත්වය උදෙසා එහි සියලුම උප අංශ මනා දායකත්වයක් සැපයීය. කර්මාන්තශාලා නිෂ්පාදන සහ ඉදිකිරීම් යන උප අංශයන්හි සිදුවූ ප්‍රසාරණය ද මෙම අංශයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. 2009 වසරේ දී ද.දේ.නි. තුළ කාර්මික අංශයේ වූ සියයට 28.6 ක දායකත්වය 2010 වසරේ දී සියයට 28.7 ක් දක්වා ආන්තිකව ඉහළ ගියේය.

**කාර්මික අංශයේ නිමැවුමෙන් ආසන්න වශයෙන් සියයට 55 ක් සඳහා දායකත්වය සපයන කර්මාන්තශාලා නිෂ්පාදන අංශය, 2009 වසරේ වාර්තා වූ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසර තුළදී සියයට 7.5 ක වර්ධනයක් වාර්තා කළේය.** දේශීය සහ විදේශීය වෙළෙඳපොළෙහි පැවැති වඩා යහපත් ආර්ථික ක්‍රියාකාරිත්වය හේතුවෙන් කර්මාන්තශාලා නිෂ්පාදන අංශයට අයත් සියළු කාණ්ඩයන්හි ඇති වූ ඉහළ ක්‍රියාකාරීත්වය මෙම වර්ධනය සඳහා මූලික විය. ගැටුම් පැවැති උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉල්ලුම ඉහළයාම, අඩු පොළී අනුපාතික, අඩු උද්ධමන වේගය සහ ව්‍යාපාරික හා පාරිභෝගික විශ්වාසය ඉහළ යාම යන කරුණු දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත සඳහා අවශ්‍ය හිතකර පරිසරය නිර්මාණය කිරීමට දායක විය. අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්තයන්හි වර්ධනය සඳහා, ගෝලීය ආර්ථික අර්බුදය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමගම ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන්ගෙන් ඇති වූ ඉහළ ඉල්ලුම, නිෂ්පාදන කළඹ ප්‍රසාරණය කිරීම, මනා ලෙස සැලසුම් කරන ලද වෙළෙඳ නාම සහ වෙළෙඳපොළ විවිධාංගීකරණ උපාය මාර්ග යන කරුණු උපකාරී විය. අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්තකරුවන් විසින් අනුගමනය කළ මෙවැනි තරඟකාරී ක්‍රියා පිළිවෙත් මඟින් අන්තර්ජාතික වෙළෙඳපොළෙහි දැනට හිමි වෙළෙඳපොළ කොටස එලෙසින්ම පවත්වා ගනිමින් නව වෙළෙඳපොළ අංශයන් ආකර්ෂණය කර ගැනීමට කර්මාන්තකරුවන්ට හැකි විය. ප්‍රධාන ඇඟළුම් සහ රෙදිපිළි නිෂ්පාදකයින් විසින් අනුගමනය කළ ඵලදායිතාවය ඉහළ නැංවීමේ සහ පිරිවැය අඩු කිරීමේ උපාය මාර්ග තුළින්, 2010 අගෝස්තු මස දී “විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය” (GSP+) යටතේ ලබාදුන් සහන අත්හිටුවීමත් සමඟ ඇති වූ තත්ත්වයට සාර්ථකව මුහුණ දීමට අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත අංශයේ, රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදිත උප කාණ්ඩයට හැකි විය.

**දේශීය සහ අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත දෙඅංශයෙන්ම කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ නිපැයුම්වල වර්ධනය පිළිබිඹු විය.** ගැටුම් පැවැති උතුරු සහ නැගෙනහිර පළාත්වල දේශීය වෙළෙඳපොළ පුළුල්වීම සහ සංචාරක කටයුතුවල ඉහළයෑම, කර්මාන්තශාලා නිමැවුමෙන් සියයට 48 කට පමණ දායකත්වයක් සපයන ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩයේ වර්ධනයට මූලික වශයෙන් දායක විය. සිමෙන්ති සහ ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා පැවැති ඉහළ ඉල්ලුම හේතුවෙන් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩයේ නිෂ්පාදන ඉහළයෑම ද කර්මාන්තශාලා නිමැවුමේ වර්ධනයට ඉහළ දායකත්වයක් සැපයීය. 2010 වසරේ දී දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් වීදුරු, පිඟන් භාණ්ඩ නිෂ්පාදිත, රැහැන්, කම්බි, යකඩ, වානේ තහඩු සහ තීන්ත ඇතුළු කර්මාන්ත සතුටුදායක වර්ධනයක් පෙන්වීය. රෙදිපිළි, ඇඟළුම්, ඛනිජ තෙල්, රබර්, යන්ත්‍රෝපකරණ සහ මෙවලම් යන අනු කාණ්ඩයන් අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්තවල ඉහළ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත කාණ්ඩයට ලෝක ආර්ථික අර්බුදයෙන් පසු යථා තත්ත්වයට පත්වීමට අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත වුවද, 2010 වසරේ හතරවන කාර්තුවේ සිට මෙම කාණ්ඩය යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්වීය. පිඟන් භාණ්ඩ, පිඟන් ගඩොල්, නාවික යාත්‍රා හා ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ආදී නිෂ්පාදිත, අපනයන භාණ්ඩ ඉලක්ක කරගත් කර්මාන්තවල වර්ධනයට දායක වූ අනිකුත් අංශ විය.

**2.7 සංඛ්‍යා සටහන**

**කර්මාන්තයන්හි එකතු කළ අගය (2002 ස්ථාවර මිල අනුව)**

| කාණ්ඩය | රු. මිලියන | | වෙනස (%) | |
|---|---|---|---|---|
| | 2009 | 2010 (අ) | 2009 | 2010 (අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 185,142 | 197,731 | 5.9 | 6.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 87,762 | 92,293 | 0.6 | 5.2 |
| 3. දැව සහ දැව නිෂ්පාදිත | 1,125 | 1,193 | 3.7 | 6.0 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම සහ මුද්‍රණය කිරීම | 1,635 | 1,742 | 2.3 | 6.5 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 59,706 | 66,990 | 1.8 | 12.2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 14,794 | 16,328 | -3.3 | 10.4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 965 | 1,028 | 0.7 | 6.5 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 32,794 | 35,482 | 3.4 | 8.2 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 2,004 | 2,138 | 5.1 | 6.7 |
| **එකතුව** | **385,927** | **414,925** | **3.4** | **7.5** |

(අ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දේශීය වෙළෙඳපොළ තවදුරටත් පුළුල් වීම හමුවේ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩය, 2009 වසරේ පැවති සියයට 5.9 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 6.8 ක වර්ධනයක් වාර්තා කළේය.** ආහාර පාන වර්ග, බේකරි නිෂ්පාදන සහ සත්ව ආහාර, මෙම කාණ්ඩයේ වර්ධනය සඳහා ඉහළ දායකත්වයක් පෙන්නුම් කළ කර්මාන්ත අතර විය. පෞද්ගලික අංශයේ නිෂ්පාදන ධාරිතාව ඉහළයෑමට ප්‍රධාන වශයෙන් කිරි නිෂ්පාදන, සීනි සහ ලුණු නිෂ්පාදන කර්මාන්ත මූලික විය. 2010 වසර තුළදී ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි "*Ceylon Tea*" සඳහා වූ ඉහළ මිල ගණන්වල ප්‍රතිඵලයක් ලෙස එකතු කළ වටිනාකමකින් යුතු තේ නිෂ්පාදනයේ සැලකිය යුතු වර්ධනයක් ඇතිවිය. ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා තේ මලු, පැකට්, ක්ෂණික තේ කුඩු, හරිත තේ සහ රස කැවූ තේ ආදී විවිධ නිෂ්පාදන සැපයීම තුළින් එකතු කළ වටිනාකමක් ඇති තේ නිෂ්පාදිත සඳහා දේශීය තේ නිෂ්පාදකයින් වැඩි වශයෙන් යොමු විය.

**අපනයන සහ දේශීය වෙළෙඳපොළ පුළුල් වීමත් සමග සකස් කරන ලද ආහාර නිෂ්පාදන උප කාණ්ඩයේ ඇති වූ ඉහළ වර්ධනය, ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩයේ සුවිශේෂී වර්ධනයට මූලික වශයෙන් දායක විය.** සකස් කරන ලද ආහාර නිෂ්පාදන උප අංශයේ අපනයන වෙළෙඳපොළ පුළුල් වීම සඳහා පළතුරු, එළවළු, කුළුබඩු, ධාන්‍ය සහ මුහුදු ආහාර වර්ගයන්හි ඉහළ නිෂ්පාදනය උපකාරී විය. තවද, දිවයින පුරා විහිදී ඇති සිල්ලර වෙළෙඳසැල් සහ සුපිරි වෙළෙඳසැල් දාමය පුළුල් වීම, පාරිභෝගික රුචිකත්වයේ ක්‍රමික වෙනස්කම් සහ සංචාරක කටයුතුවල ඉහළ වර්ධනය, දේශීය වෙළෙඳපොළේ සකස්කරන ලද ආහාර නිෂ්පාදන උප අංශයේ වර්ධනයට හිතකර ලෙස බලපෑවේය. එසේම, මෙම උප අංශයට අයත් නිෂ්පාදකයන්ට, ආහාර සුරක්ෂිතභාවය සහ ආරක්ෂණය සම්බන්ධව අන්තර්ජාතික වශයෙන් පිළිගත් ප්‍රමිති සහතික ලබාගැනීම සහ තාක්ෂණික ශ්‍රේණියේ සේවකයන් පුහුණු කිරීමේ කටයුතු සිදු කිරීම තුළින්, ජාත්‍යන්තර ගැණුම්කරුවන් ආකර්ෂණය කර ගැනීමට හැකි විය. ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳපොළට කුරුඳු සහ වෙනත් කුළුබඩු සපයන ප්‍රධාන අපනයනකරුවකු වුවද එකතු කළ වටිනාකමින් යුතු කුරුඳු ඇතුළු වෙනත් කුළුබඩු නිෂ්පාදන අපනයනය ඉතා අඩු මට්ටමක පැවැතිණ. එසේ වුවද, එකතු කළ වටිනාකමකින් යුත් කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදිත අපනයනකරුවන් විසින් යාන්ත්‍රික වියළීම සහ ඇඹරීම වැනි නවීන නිෂ්පාදන ක්‍රම උපයෝගී කර ගනු ලැබීම තුළින් යුරෝපය, ජපානය සහ ඇමරිකාව වැනි රටවල අලුත් වෙළෙඳපොළවල් ආකර්ශණය කර ගැනීමට කටයුතු කරන ලදී.

**2009 වසර තුළදී සියයට 0.6 ක ආන්තික වර්ධනයක් පෙන්නුම් කළ රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත අංශය, 2010 වසරේ දී සියයට 5.2 කින් වර්ධනය විය.** අනෙකුත් ආසියාතික රටවල ඇඟළුම් නිෂ්පාදකයින්ගෙන් එල්ල වූ ඉහළ තරඟකාරීත්වය, ''විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය'' (GSP+) යටතේ ලබාදුන් විශේෂ සහන අහිමිවීම, පුහුණු ශ්‍රමිකයන්ගේ සහ ආනයනික අමු ද්‍රව්‍යවල ඉහළ පිරිවැය ආදී විවිධ අභියෝග හමුවේ වුවද, ඉහළ ගුණාත්මක භාවයකින් යුතු රෙදිපිළි නිෂ්පාදන, ජාත්‍යන්තරව ප්‍රචලිත ප්‍රමුඛ වෙළෙඳ ආයතන වෙත සපයමින් තරඟකාරීව සිටීමට දේශීය ඇඟළුම් කර්මාන්තකරුවන්ට හැකි විය. "නියමිත ආචාර ධර්මයන්ට අනුකූලව ඇඟළුම් නිෂ්පාදනය", "ප්‍රමිතීන්ට අනුකූලව ඇඟළුම් නිපදවීම" සහ "පරිසර හිතකාමී ලෙස නිපැයූ ඇඟළුම්" වැනි තේමාවන් යටතේ උපාය මාර්ගික වැඩ සටහන් දියත් කරමින්, ජාත්‍යන්තර වෙළෙඳපොළට උසස් තත්ත්වයේ නිමි ඇඳුම් සැපයීම තුළින් තම නිෂ්පාදිතයන් සඳහා වූ ජාත්‍යන්තර කීර්ති නාමය තවදුරටත් පවත්වා ගැනීමට ප්‍රධාන පෙළේ ඇඟළුම් නිෂ්පාදකයින්ට හැකියාව ලැබිණ.

**2010 වසරේ දී රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත කාණ්ඩයේ වර්ධනය සඳහා කළමනාකරණ හැකියාවන් වර්ධනයට වැඩි අවධානයක් යොමු කිරීම, ඉහළ කාර්යක්ෂමතාව සහ නිෂ්පාදන ක්‍රියාවලියේ උසස් තත්ත්ව පාලනය යන කරුණු**


ප්‍රධාන වශයෙන් දායක විය. ඇඟළුම් නිෂ්පාදන සඳහා දැනට පවතින විදේශීය වෙළෙඳපොළවල් විවිධාංගීකරණය කිරීමේ අරමුණින්, ආසියානු කලාපයේ සුවිශේෂී වෙළෙඳපොළවල් හඳුනාගැනීම ඔස්සේ තම නිෂ්පාදිත තවදුරටත් ප්‍රචලිත කිරීම සඳහා ඇඟළුම් නිෂ්පාදකයින් උත්සුක විය. ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නවීකරණ වැඩ සටහන් අතර, නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඉවත දමන රෙදිපිළි උපයෝගී කරගනිමින් විශේෂ නිර්මාණ යෙදූ නවීන පන්නයේ විලාසිතා ඇතුලත් "නැවත සකස් කරන ලද නිර්මාණ" ලෙසින් බටහිර ප්‍රධාන පෙළේ සන්නම් නාම යටතේ වෙළෙඳපොළට ඉදිරිපත් කරන ලදී. ''විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය'' (GSP+) යටතේ ලබාදුන් විශේෂ ප්‍රතිලාභ 2010 අගෝස්තු මස සිට ඉවත්කරගැනීම හේතුවෙන් රෙදිපිළි සහ ඇඟළුම් අපනයනය වෙත ඇතිවිය හැකි සෘණාත්මක බලපෑම කෙරෙහි මෙම ක්ෂේත්‍රය තුළ යම් අවධානයක් පැවැතිය ද, 2010 වසරේ අවසාන කාර්තුවේ දී යුරෝපීය සහ ඇමෙරිකා එක්සත් ජනපද රටවලින් ලැබුණු ඇණවුම් ප්‍රමාණයේ ඉහළ වර්ධනය තුළින් අපනයන ඉපයුම් වල සැලකිය යුතු වර්ධනයක් ඇති විය.

**රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩය 2009 වසරේ පැවැති සියයට 1.8 ක වර්ධනයට සාපේක්ෂව, 2010 වසරේ දී සියයට 12.2 ක වර්ධනයක් වාර්තා කළේය.** ස්වභාවික සහ කෘත්‍රිම රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා පැවැති ඉහළ ඉල්ලුම හමුවේ, රබර් ආශ්‍රිත නිෂ්පාදිත උප කාණ්ඩය 2010 වසරේ දී ඉහළ ක්‍රියාකාරීත්වයක් වාර්තා කළේය. ස්වභාවික රබර් සඳහා පවතින ලෝක වෙළෙඳපොළ මිල ඉහළ යාමට මෝටර් රථ නිෂ්පාදන අංශය යථා තත්ත්වයට පත්වීම ඉවහල් විය. යුරෝපීය සහ ඇමෙරිකානු ආර්ථිකයන් ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය වශයෙන් නිෂ්පාදිත ඝන ටයර් නිෂ්පාදනයේ සැලකිය යුතු වර්ධනයක් ඇති විය. එසේම, 2010 වසරේ දී ඉදිකිරීම් ක්ෂේත්‍රය නැවත යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් PVC සහ තීන්ත නිෂ්පාදන කර්මාන්තයන්හි ද වර්ධනයක් වාර්තා විය.

**ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩය, 2009 වසරේ දී වාර්තා වූ සියයට 3.3 ක සෘණ වර්ධනයට සාපේක්ෂව, 2010 වසරේ දී සියයට 10.4 ක වර්ධනයක් වාර්තා කළේය.** මෙම කාණ්ඩයේ මූලික උප කාණ්ඩයක් වන සිමෙන්ති, ගඩොල් සහ උළු නිෂ්පාදනයේ ඉහළ වර්ධනය සඳහා පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතු ඉහළයාම, රජයේ යටිතල පහසුකම් ව්‍යාපෘති අඛණ්ඩව පවත්වාගෙනයාම සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීම් සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති හේතු විය. උසස් තත්ත්වයේ පෝසිලේන් නිෂ්පාදන සහ පිඟන් ගඩොල් සඳහා යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදයෙහි වෙළෙඳපොළවල ක්‍රමික පිබිදීම තුළින් මෙම නිෂ්පාදන උප කාණ්ඩය වර්ධනය විය. ලොවේ මිල අධිකතම පිඟන් භාණ්ඩ ලෙස සැලකෙන "*Bone China Tableware*" වැනි උසස් තත්ත්වයෙන් යුත් නිෂ්පාදිත හඳුන්වාදීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳපොළේ තම ස්ථාවරත්වය තවදුරටත් තහවුරු කර ගැනීමට පිඟන් භාණ්ඩ අපනයනකරුවන්ට හැකි විය. නව මුහුණත් සැළසුම් මෝස්තර සහ හැඩතල නිර්මාණය කිරීම සඳහා අන්තර්ජාතික පිඟන් මෝස්තර නිර්මාණ ශිල්පීන් යොදා ගැනීම තුළින් පෝසිලේන් නිෂ්පාදකයින් තම නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම සඳහා පියවර ගන්නා ලදී. සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයට අනුගාමීව හෝටල් ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ කටයුතුවල ඉහළ යාම හේතුවෙන් ඉහළ ගුණත්වයෙන් යුත් පෝසිලේන් සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදන සඳහා පැවැති දේශීය ඉල්ලුම ඉහළ ගියේය. මූලික වශයෙන් අභ්‍යන්තර ගැටුම් පැවැති ප්‍රදේශවල පාන වර්ග සඳහා පැවැති ඉල්ලුම ඉහළ යාම තුළින් වීදුරු නිෂ්පාදන කටයුතු වල සැළකිය යුතු වර්ධනයක් 2010 වසරේ දී වාර්තා විය.

**සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ කාණ්ඩයෙහි 2009 වසරේ වාර්තා වූ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව, 2010 වසරේ දී සියයට 8.2 ක වර්ධනයක් වාර්තා විය.** මෙම කාණ්ඩය සඳහා වැඩිම දායකත්වයක් සපයන නැව් සහ බෝට්ටු නිෂ්පාදන උප කාණ්ඩය, 2010 වසරේ දී පැවැති ගෝලීය නාවික කර්මාන්තයේ පසුබෑස්ම හමුවේ වුවද ප්‍රශංසනීය ප්‍රගතියක් පෙන්වීය. විශේෂයෙන්ම, මධ්‍යම ප්‍රමාණයේ නැව් සහ බෝට්ටු නිෂ්පාදනය තුළින්, අන්තර්ජාතික ඇණවුම් විශාල ප්‍රමාණයක් සැපයීමට

**2.3 රූප සටහන** — **කර්මාන්තයන්හි එකතු කළ අගය-2010 (2002 ස්ථාවර මිල අනුව)**



දේශීය නැව් සහ බෝට්ටු නිෂ්පාදකයින්ට හැකියාව ලැබිණ. දේශීය නැව් නිෂ්පාදකයින් 2010 වසරේදී, මගීන් රැගෙන යා හැකි මුහුදු යාත්‍රාවන් ඉදිකල අතර, ඇදගෙනයාමේ යාත්‍රා, මඩ හා වැලි අදින යාත්‍රා සහ බහුකාර්ය යාත්‍රා නිෂ්පාදනය සහ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ලදී.

**උතුරු සහ නැගෙනහිර පළාත්වල මුහුදු තීරය ධීවර කටයුතු සඳහා යළි විවෘත වීම බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය ක්‍රමිකව යථා තත්ත්වයට ගෙන ඒම සඳහා දායක විය.** දේශීය වශයෙන් නිෂ්පාදිත වාණිජ බෝට්ටු, විනෝදය සඳහා වන බෝට්ටු සහ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ සුඛෝපභෝගී යාත්‍රා සඳහා 2010 වසරේ දී ඉහළ වෙළෙඳපොළ ඉල්ලුමක් පැවැතිණ. විනෝදය සඳහා වන බෝට්ටු නිෂ්පාදකයින් විසින් ජාත්‍යන්තර වෙළෙඳපොළේ, විශේෂයෙන්ම යුරෝපය, මුරිසිය, සොලමන් දූපත්, සිංගප්පූරුව සහ මැදපෙරදිග, තම වෙළෙඳ ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් කර ගැනීමට කටයුතු කරන ලදී. එසේම, උතුරු සහ නැගෙනහිර මුහුදු තීරය ආශ්‍රිතව ක්‍රමයෙන් වර්ධනය වන සංචාරක කර්මාන්තය සහ සාගර ගවේෂණය සඳහා අවශ්‍ය විවිධ මාදිලියේ බෝට්ටු සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම අපේක්ෂා කෙරේ.

**රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙන් සියයට 95 කට වඩා වැඩි දායකත්වයක් සපයන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ඍණාත්මක වර්ධනය හේතුකොටගෙන රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමේ පහළ යාමක් වාර්තා විය.** ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සැළසුම්ගත නඩත්තු කටයුතු සඳහා මාස දෙකක කාලයකට තෙල් පිරිපහදු කටයුතු අත්හිටුවීම හේතුවෙන් එහි නිෂ්පාදනය 2009 වසරට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 13 කින් පහළ ගියේය. සීමාසහිත ලංකා ඛනිජ වැලි සංස්ථාව 2010 වසර තුළ දී සියයට 39 ක ධාරිතා උපයෝජනයක් වාර්තා කරමින් නිෂ්පාදනයේ සියයට 53 ක වර්ධනයක් වාර්තා කළේය. එසේම, සීමාසහිත ලංකා ලුණු සමාගම සහ සීමාසහිත ලංකා පොස්ෆේට් සමාගම ද 2010 වසරේ දී ධනාත්මක වර්ධන අනුපාතයන් පෙන්වීය. පසුගිය වසරට සාපේක්ෂව අඩු නිෂ්පාදනයක් පෙන්නුම් කළ රාජ්‍ය කාර්මික ආයතන අතර, සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව, සීමාසහිත ජාතික කඩදාසි සමාගම සහ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විය. පාඩු ලබන සහ වසා දමා ඇති රාජ්‍ය ආයතන නැවත ලාභ ලබන ආයතන බවට පත් කිරීම සඳහා රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් මේ වනවිටත් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි නිමැවුම් ලාභ අනුපාත, පෙර වසරේ දී පහත වැටීමක් පෙන්නුම් කළ ද, 2010 වසරේ දී සියයට 2.1 කින් වර්ධනය විය.** 2010 වසර තුළ පැවැති යහපත් ව්‍යාපාරික වාතාවරණය, ලාභදායිත්වය ඉහළයාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වඩා යහපත් දේශීය සාධක හේතුවෙන් විකුණුම් ප්‍රමාණය ඉහළ යාම, විකුණුම් ආදායම වැඩිවීම සඳහා දායක වූ අතර, පොලී පිරිවැය අඩුවීම, විකල්ප බලශක්ති ප්‍රභව භාවිතය සහ ඵලදායිත්වය ඉහළ යාම හේතුවෙන් වසර තුළදී නිමැවුම් ලාභ අනුපාතයේ ධනාත්මක වර්ධනයක් පෙන්වීය. එසේම, දේශීය මෙන්ම විදේශීය ඉල්ලුම ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ආනයනික සහ දේශීය අමු ද්‍රව්‍ය පිරිවැය ඉහළ ගිය ද 2009 වසරේ දී මුළු පිරිවැයෙන් සියයට 3.3 ක් වූ පොලී පිරිවැය, 2010 වසරේ දී සියයට 2.6 ක් දක්වා සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කර ඇත. 2009 වසරේ ඉල්ලුම අඩුවීම හේතුකොටගෙන ඵලදායිතාවය පහළ ගිය ද, 2010 වසරේ අවසාන කාර්තුව තුළදී රෙදිපිළි කර්මාන්තශාලා උපරිම ධාරිතාවකින් ක්‍රියාත්මකවීම හේතුවෙන් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත කාණ්ඩයේ ඵලදායිතාව යථා තත්ත්වයට පත් විය.

**ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධනය සඳහා රජය විසින් "ගමට කර්මාන්ත" වැඩ සටහන ඔස්සේ විවිධ දිරිගැන්වීම් ලබාදීම තුළින් අඛණ්ඩ දායකත්වයක් සපයන ලදී.** කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය මඟින් අඛණ්ඩව ක්‍රියාත්මක වන මෙම වැඩසටහන තුළින් ග්‍රාමීය ප්‍රදේශවල නව රැකියා අවස්ථා නිර්මාණය වීම මෙන්ම කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල කර්මාන්ත කේන්ද්‍රණය වීම අවම වීම ද සිදු විය. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශීය කර්මාන්ත අනුමත කිරීමේ කමිටුව (DIAC) මගින්, 2010 වසරේ දී ව්‍යාපෘති 111 ක් අනුමත කරන ලද අතර, ඉන් කර්මාන්ත 58 ක් දැනටමත් වාණිජ කටයුතු අරඹා ඇත. තවත් ව්‍යාපෘති 11 ක් ක්‍රියාවට නැංවීමේ විවිධ අදියරයන්හි පවතී.

**ප්‍රාදේශීය මට්ටමේ දේශීය ආයෝජන දිරිමත් කිරීම සඳහා කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින්, 2010 වසරේ දී ද කාර්මික ජනපද සංවර්ධන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** 2010 වසර තුළ දී, ඒ සඳහා වෙන්වුණු මුළු බිම් කොටස් 608 කින් බිම් කොටස් 451 ක් අනුමත කර ඇති අතර, ඉන් කර්මාන්ත 270 ක් වාණිජ කටයුතු අරඹා ඇත. කර්මාන්තශාලා 33 ක් ඉදිකිරීම් මට්ටමේ පවතී. බුත්තල, ඇඹිලිපිටිය හා ගලිගමුව කාර්මික ජනපදවල සංවර්ධන කටයුතු

**2.8 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි නිමැවුම් ලාභ අනුපාතික (අ)**

| කාණ්ඩය | මුළු නිෂ්පාදන පිරිවැය (රු. මිලියන) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු. මිලියන) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|
| | 2009 (ආ) | 2010 (ඇ) | 2009 (ආ) | 2010 (ඇ) | 2009 (ආ) | 2010 (ඇ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 132,956 | 146,456 | 155,992 | 172,283 | 14.8 | 15.0 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 36,214 | 41,236 | 40,885 | 46,965 | 11.4 | 12.2 |
| 3. දැව සහ දැව නිෂ්පාදිත | 2,835 | 3,205 | 3,216 | 3,642 | 11.8 | 12.0 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම සහ මුද්‍රණය කිරීම | 9,123 | 10,273 | 10,415 | 11,742 | 12.4 | 12.5 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 72,273 | 83,398 | 85,106 | 98,563 | 15.1 | 15.4 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 45,628 | 53,621 | 52,747 | 62,161 | 13.5 | 13.7 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 4,498 | 5,042 | 5,220 | 5,864 | 13.8 | 14.0 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 28,206 | 32,356 | 32,678 | 37,578 | 13.7 | 13.9 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5,514 | 6,411 | 6,295 | 7,335 | 12.4 | 12.6 |
| **එකතුව** | **337,247** | **381,998** | **392,554** | **446,133** | **14.1** | **14.4** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

නිමාකර නව ව්‍යාපෘතීන් ඇරඹීමට කටයුතු කෙරෙන අතර, පල්ලේගොඩවත්ත සහ මාදම්පේ කාර්මික ජනපදවල ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. තවද, කටාන, පල්ලෙකැලේ සහ කුරුණෑගල යන යෝජිත කාර්මික ජනපදවල මූලික ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භව පවතී. "නැගෙනහිර නවෝදය" සහ "උතුරු වසන්තය" වැඩසටහන්වලට සමගාමීව මෙම වැඩසටහන තුළින් ද, උතුරු සහ නැගෙනහිර පළාත් සංවර්ධනය ඉලක්ක කර ගනිමින් මඩකලපුව, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි යෝජිත කාර්මික ජනපද ඉදිකිරීම සඳහා මූලික වැඩ කටයුතු අරඹා ඇති අතර, ත්‍රිකුණාමලය (කප්පල්තුරෙයි) කාර්මික ජනපදයේ ආදර්ශ කර්මාන්තශාලා හයක ඉදිකිරීම් කටයුතු නිම කෙරෙමින් පවතී.

**කර්මාන්තශාලා ප්‍රාදේශීයකරණය කිරීම අරමුණු කරගනිමින්, 2010 වසර තුළදී ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් "නිපැයුම් ශ්‍රී ලංකා-කර්මාන්තශාලා 300 වැඩ සටහන" ක්‍රියාත්මක කරනු ලැබීය.** මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 260 ක් සඳහා අනුමැතිය ලැබී ඇති අතර, ඉන් ව්‍යාපෘති 224 ක ගිවිසුම් අත්සන් කර ඇත. තවද, ව්‍යාපෘති 132 ක වාණිජ කටයුතු අරඹා ඇති අතර, ව්‍යාපෘති 36 ක ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවතිණි. මෙම වැඩසටහනේ මුළු ආයෝජන වලින් වැඩි ප්‍රමාණයක් සංචාරක, රෙදිපිළි සහ ඇඟළුම් නිෂ්පාදන අංශයන් වෙත යොමු වී ඇත.

**නව රැකියා සහ ආදායම් උත්පාදන අවස්ථා නිර්මාණය කිරීම මූලික කරගනිමින්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය දිරි ගැන්වීම සඳහා රජය විසින් අඛණ්ඩ ප්‍රයත්නයන් දරනු ලැබීය.** ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින්, මෙම අංශය සංවර්ධනය කිරිම සඳහා අවශ්‍ය උපාය මාර්ග සම්පාදනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදි. 2010 වර්ෂය තුළදී ලෝක බැංකුව මඟින් "අර්බුදයන්ට මුහුණ දීම සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය" යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු විය. මෙම යෝජනා ක්‍රමය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන්ට මූල්‍ය පහසුකම් ලබාදීමේදී, ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම, අර්ධ ණය සහතික කිරීම මෙන්ම අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම යනාදිය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පහසුකම් සලසන ලදී. ගෝලීය ආර්ථික අර්බුදය මඟින් දැඩි බලපෑමට ලක් වූ උප කොන්ත්‍රාත් පදනම යටතේ ක්‍රියාත්මක වන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් කිරීම මෙන්ම ඔවුනට සියයට 10 ක සහනදායී ආදායම් බදු අනුපාතයක් ලබාදීමට ද 2011 අයවැය මඟින් යෝජනා කර ඇත.

**කර්මාන්තශාලා නිෂ්පාදන උප අංශයේ එකතුකළ අගයට ඉහළ දායකත්වයක් ලබාදෙන විදේශ විනිමය උපයන ප්‍රධාන කාණ්ඩයන් සඳහා 2011 අයවැයෙන් දිරිගැන්වීම් කිහිපයක් යෝජනා කර ඇත.** රෙදිපිළි, සම් භාණ්ඩ, පාවහන්, ගමන් මළු සහ ධාන්‍ය මිශ්‍ර බේකරි නිෂ්පාදිත සඳහා යොදාගන්නා යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, ආනයන බදු සහ එකතුකළ අගය මත පැනවෙන බදු වලින් නිදහස් කර ඇති අතර, බේකරි නිෂ්පාදන කර්මාන්තයට අයත් තෝරාගත් අමු ද්‍රව්‍ය සඳහා තීරු බදු අඩුකර ඇත. ආනයන, පිළි සැකසුම් සහ ප්‍රති අපනයන මෙන්ම ප්‍රති නැව්ගත කිරීම් කටයුතු ඇතුළු අක්වෙරළ වෙළෙඳ කටයුතු දියුණු කිරීම

සඳහා ද, දිරිගැන්වීම් ලබා දී ඇත. ඇඟළුම් අංශයේ අඛණ්ඩ වර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා රෙදිපිළි කර්මාන්තයේ ප්‍රමුඛ ගැණුම්කරුවන්ට ශ්‍රී ලංකාව තුළ තම ප්‍රධාන කාර්යාල පිහිටුවීමට අවශ්‍ය කරන දිරිගැන්වීමක් ලෙස ඔවුන්ගේ විදේශ විනිමය ඉපැයීම් ආදායම් බදු වලින් නිදහස් කොට ඇත.

2011 අයවැය මඟින්, **දේශීය වෙළෙඳ නාම ප්‍රවර්ධනයට සහ ඉහළ එකතු කළ අගයක් සහිත දේශීය කර්මාන්ත උනන්දු කරවීමට දිරි ගැන්වීම් මාලාවක් සපයා ඇති අතර, ආර්ථිකමය වැදගත්කමකින් යුත් හා නැගී එන කර්මාන්ත සඳහා වෙනත් විවිධ දීමනා ලබා දී ඇත.** ඉහළ එකතු කළ අගයකින් යුත් අපනයන දිරි ගැන්වීම පිණිස ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන සියලුම නොනිමි සහ අර්ධ නිමි අපනයනයන් මත සෙස් බද්දක් පැනවීමටත් නිමි භාණ්ඩ අපනයන සෙස් බද්දෙන් නිදහස් කිරීමටත් තීරණය කර ඇත. දේශීය එකතු කළ අගය සියයට 65 කට වඩා වැඩි කර්මාන්තවල සහ ශ්‍රී ලංකාවේ පේටන්ට් හිමිකම ලබාගත් දේශීය සන්නම් නාම භාවිතා කරන කර්මාන්තවල ආදායම් බදු සියයට 15 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී. ආයුර්වේද සංයෝග ඇතුළුව ඖෂධ නිෂ්පාදන ඇසිරීමට භාවිතා කරන ඇතැම් වීදුරු සහ ප්ලාස්ටික් බෝතල් මත රේගුව විසින් අයකරනු ලබන බද්ද අඩුකර ඇති අතර, ඖෂධ නිෂ්පාදනය වෙනුවෙන් යොදාගන්නා අමු ද්‍රව්‍ය ආනයන කටයුතු ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කර ඇත. කෙසේ වෙතත්, දුම්කොළ සහ මත්පැන් නිෂ්පාදනය සහ බෙදා හැරීමේ නියැලෙන ව්‍යාපාරික ආයතනවල ලාභය මත අය කරනු ලබන බද්ද සියයට 40 දක්වා වැඩි කර ඇත.

**ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් අදාළ විවිධ ආයතනවලට ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් යෝජනා කර ඇත.** රජය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය නවීකරණය කිරීමට ඉලෙක්ට්‍රොනික දත්ත හුවමාරු පද්ධතියක් පිහිටුවීමට යෝජනා කර ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මීට පෙර අනුගමනය කළ රටවල් පදනම් කරගත් ආයෝජන සංකල්පයෙන් බැහැරව, කර්මාන්ත අංශ පදනම් කරගත් ප්‍රතිපත්තියක් කරා යොමු වෙමින් සිටී. මෙහිදී දේශීය හා විදේශීය ආයෝජකයින්ට විවිධ කර්මාන්ත අංශ පිළිබඳව මඟ පෙන්වීමත්, ව්‍යාපාර අනුමත කිරීමේ සහ වාණිජ කටයුතු ඇරඹීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමත්, හඳුනාගත් වැදගත් කර්මාන්ත අංශ සඳහා "එක් ස්ථානයකදී සියළු සේවා සැපයීමේ" සහ "අංශ කණ්ඩායම්" යන විශේෂ සේවාවන් හඳුන්වා දෙන ලදී.

2010 වසරේ දී රජය **කාර්මික ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, 2011 අයවැය තුළින් විවිධ රේඛීය අමාත්‍යාංශ ඔස්සේ නොයෙකුත් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කර ඇත.** දැනට පවත්නා අපනයන සැකසුම් කලාපවල කාර්යක්ෂම උපයෝජනයක් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හරහා නව ආයෝජකයින් ආකර්ෂණය කරගැනීමට රජය දැනටමත් මූලික පියවර ගෙන ඇත. මේ අනුව, දැනට පවතින ආයෝජන ප්‍රවර්ධන කලාප 12 හි ප්‍රයෝජනයට නොගත් ඉඩම් කැබලි ව්‍යාපාර සඳහා වෙන් කිරීමේ දී, ප්‍රමුඛතාවය වැඩි අංශ ලෙස ඉහළ එකතු කළ අගයක් සහිත, මහා පරිමාණ ආයෝජන සඳහා මුල්තැන දෙනු ලැබේ.

**මේ අතර, 2011 නොවැම්බර් මස පටන් විදේශීය හා දේශීය සමාගම්වලට විදේශ ප්‍රභවයන්ගෙන් ණය ලබා ගැනීමට අවසර දී ඇත.** රජය හා නොයෙකුත් වෙනත්

**2.9 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි දේශීය පිරිවැය ව්‍යුහය (අ)**
**(මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| කාණ්ඩය | බලය සහ ඉන්ධන | | වැටුප් | | අමුද්‍රව්‍ය | | පොලිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2009 | 2010 (ආ) | 2009 | 2010 (ආ) | 2009 | 2010 (ආ) | 2009 | 2010 (ආ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 3.8 | 3.8 | 10.7 | 10.8 | 40.8 | 41.2 | 2.1 | 1.6 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 5.2 | 5.4 | 15.5 | 15.6 | 13.8 | 14.1 | 3.4 | 2.8 |
| 3. දැව සහ දැව නිෂ්පාදිත | 10.2 | 10.5 | 16.7 | 17.2 | 33.6 | 34.0 | 5.0 | 3.8 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම සහ මුද්‍රණය කිරීම | 4.9 | 5.1 | 13.3 | 13.6 | 20.2 | 20.7 | 4.2 | 3.2 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 7.1 | 7.3 | 13.9 | 14.3 | 31.5 | 32.3 | 4.4 | 3.0 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 21.4 | 21.6 | 15.5 | 15.9 | 30.1 | 31.0 | 4.5 | 3.0 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 10.3 | 10.6 | 11.1 | 11.4 | 36.4 | 36.8 | 2.9 | 1.9 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5.7 | 5.8 | 12.9 | 13.0 | 27.6 | 29.2 | 5.2 | 3.4 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5.8 | 6.0 | 12.2 | 12.3 | 35.0 | 35.3 | 2.1 | 1.5 |
| **එකතුව** | **7.0** | **7.2** | **12.8** | **13.0** | **33.5** | **33.8** | **3.3** | **2.6** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) තාවකාලික

ආයතන විසින් නවෝත්පාදන කාර්මික නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළට ලබාදීමට පහසුකම් සැලසීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ක්‍රියා මාර්ග යටතේ, හරිත නිෂ්පාදනවල ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා පරිසර හිතකාමී සංවර්ධන ප්‍රතිපත්ති හඳුන්වාදීම මෙන්ම දේශීය හා ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට අවධානය යොමු කොට ඇත. රජය විසින් දියත් කරන ලද "හරිත ලංකා" වැඩ සටහන තුළින් සියළු කර්මාන්තයන් සම්පත් භාවිතයේදී කාර්යක්ෂම, පරිසර හිතකාමී සහ සමාජයීය වගකීමක් සහිත වීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කර ඇත. ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තරඟකාරී වීම සඳහා රජය විසින් "හරිත කර්මාන්ත ප්‍රකාශනයට" ද අත්සන් තබා ඇත. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද "ස්විච් ඒෂියා" (Switch Asia) ව්‍යාපෘතිය මගින්, තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ආහාර සහ පාන වර්ග උප කාණ්ඩයට අයත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිගැන්වීමට ක්‍රියා කරන ලදී.

**රජය විසින් පෞද්ගලික අංශයේ ද සහභාගීත්වය ඇතිව නැනෝ තාක්ෂණික උද්‍යානයක් පිහිටුවීමට ද, "ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික ආයතනය" (*SLINTec*) පිහිටුවීමට ද මූලික පියවර ගෙන ඇත.** පාරිසරික, ආර්ථික සහ සමාජයීය වශයෙන් හිතකාමී පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සහ අදාල පර්යේෂකයන්ට බුද්ධිමය දේපල හිමිකම් අත්පත් කර ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම සඳහා මෙම ආයතනය ක්‍රියාත්මක වේ. රාජ්‍ය සහ පෞද්ගලික

**2.10 සංඛ්‍යා සටහන — ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි ශ්‍රම ඵලදායීතා දර්ශකය (අ)**

1995=100

| කාණ්ඩය | 2009 | 2010 (ආ) | වෙනස (%) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 146.0 | 150.1 | 2.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 127.6 | 132.2 | 3.6 |
| 3. දැව සහ දැව නිෂ්පාදිත | 114.0 | 117.1 | 2.7 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම සහ මුද්‍රණය කිරීම | 114.0 | 116.8 | 2.5 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 159.4 | 165.6 | 3.9 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 123.8 | 127.3 | 2.8 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 110.8 | 113.6 | 2.5 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 139.1 | 144.2 | 3.7 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 122.9 | 125.9 | 2.2 |
| **එකතුව** | **134.7** | **138.8** | **3.0** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) තාවකාලික

අංශවල පර්යේෂණ සහ සංවර්ධන වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට දෙකක් දක්වා වැඩි කිරීම ඉලක්ක කර ගනිමින් 2011 අයවැය මගින් දේශීය පේටන්ට් බලපත්‍ර සහිත කර්මාන්තවල ආදායම් බදු අනුපාතය සියයට 15 සිට සියයට 10 දක්වා අඩු කිරීම තුළින් දිරිගැන්වීම් ලබා දී ඇත.

**දේශීය නිෂ්පාදකයින්ගේ කාර්මික අපනයන ප්‍රවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සක්‍රීයව දායකත්වය සපයන ලදී.** සුවිශේෂී අපනයන වෙළෙඳපොළවල් ආකර්ෂණය කර ගැනීම සඳහා "වැසි වනාන්තර රැක ගැනීමේ මිත්‍ර සම්මුතිය", "ඕසෝන් ස්ථරයට හානි නොවන නිෂ්පාදිත", "භූගෝලීය දර්ශක" සහ "ආචාරධර්ම අනුව නිෂ්පාදනය වූ" වැනි තේමාවන් යටතේ ඉහළ එකතු කළ වටිනාකමක් සහිත සකස් කරන ලද ආහාර අපනයන වෙළෙඳපොළ තුළ ප්‍රචලිත කිරීමට අවධානය යොමු කරන ලදී. එසේම, විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ දූත කණ්ඩායම් සහ ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ ආයෝජකයින් සහ නියෝජිතයන් සඳහා අවශ්‍ය මග පෙන්වීමේ කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කටයුතු කළ අතර, දේශීය කර්මාන්තකරුවන් විදේශ වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගි කරවීමට අවශ්‍ය පහසුකම් සැලසීම සහ ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් හමුවන "ආයෝජන හමුවීම්" සැළසුම් කිරීමට අපනයන සංවර්ධන මණ්ඩලය සක්‍රියව දායක විය.

**පතල් හා කැණීම් උප අංශය පෙර වසරේ දී වාර්තා කළ සියයට 8.2 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 15.5 කින් වර්ධනය විය.** මැණික් සහ අනෙකුත් කැණීම් යන දෙකොටසම මෙම අංශයෙහි ප්‍රසාරණයට දායක විය. 2009 වසරේ දී සියයට 18.1 ක වර්ධනයක් පෙන් වූ අනෙකුත් කැණීම් උප අංශය 2010 වසරේ දී වාර්තා කළ සියයට 17.5 ක අඛණ්ඩ වර්ධනය පතල් හා කැණීම් අංශයෙහි වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ඉදිකිරීම් කටයුතු වැඩි වීම හේතුවෙන් ඇති වූ ඉල්ලුම මඟින් මෙම ඉහළ වර්ධනය සවිමත් වූ අතර ඛණිජ වැලි, මිනිරන් සහ පොස්පේට් නිමැවුම් ඉහළ යාම මඟින් ද අනෙකුත් කැණීම් කටයුතු අංශයෙහි වර්ධනය පිළිබිඹු කෙරිණි. මේ අතර, 2009 වසරේ දී සියයට 17.2 කින් සංකෝචනය වූ මැණික් කැණීම් උප අංශය 2010 වසරේ දී සියයට 7.9 කින් වර්ධනය විය. මැණික් අපනයන පරිමාවෙහි ඇති වූ සියයට 2.6 ක වර්ධනය මඟින් විදහා දැක්වෙන ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි මැණික් සඳහා වූ ඉල්ලුම හිතකර ලෙස ඉහළ යාම මෙම අංශය යථා තත්ත්වයට පත්වීම සඳහා උපකාරී විය.

**විශේෂ සටහන 4**

## කර්මාන්ත සංවර්ධනයට නැනෝ තාක්ෂණය යොදා ගැනීම

නැනෝතාක්ෂණය යනු නිෂ්පාදිතවල පවතින මුහුණුවර වෙනස්කර නව ලක්ෂණවලින් යුත් සුවිශේෂී භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හැකියාවක් ඇති අභිනව සොයාගැනීමකි. පරමාණු වැනි ඉතා සියුම් මට්ටමක දී ද්‍රව්‍යවල අන්තර්ගතය වෙනස් කිරීමෙන් එහි ආවේණික ගති ලක්ෂණ වෙනස් කිරීම මේ හා සම්බන්ධ වේ. ඒ අනුව, නැනෝතාක්ෂණය යොදාගන්නා අවස්ථාවන් බොහොමයක් කර්මාන්ත අංශයේ විවිධ ක්ෂේත්‍රවල දැකිය හැකිය.

### නැනෝතාක්ෂණය භාවිතාවන අවස්ථා කිහිපයක්

අද බොහෝ රටවල් විසින් ඔවුන්ගේ කර්මාන්ත අංශය වැඩිදියුණු කිරීම සඳහා නවීන පන්නයේ නිෂ්පාදිත අඩු පිරිවැයකින් නිපදවීමට නැනෝතාක්ෂණය භාවිතා කරයි. උදාහරණයක් ලෙස සාමාන්‍ය රෙදිපිළි, නැනෝතාක්ෂණය යොදා ගනිමින් දියර සහ වෙනත් ද්‍රව්‍ය උරා නොගන්නා රෙදිපිළි බවට සකස් කිරීමට හැකි වන අතර, මේ නිසා පැල්ලම් සහ ඉහිරීම්වලින් බලපෑමක් නොවන විශේෂ ගුණයක් මෙම රෙදිපිළිවලට ලැබේ. එමෙන්ම, නෙළුම් මලේ දැකිය හැකි ජලය නොරැඳෙන විශේෂ ගුණාංගය, නැනෝතාක්ෂණය යොදා ගනිමින් තීන්තවල ඇති කිරීමෙන් තීන්ත ආලේප කරන බිත්ති දූවිලි සහ ජලය එකතු නොවී දිගුකලක් මුළුල්ලේ පිරිසිදුව තබාගැනීමට හැකි වී තිබේ. තවද ඉතා උස ගොඩනැගිලිවල වීදුරු ජනේල පිරිසිදු කිරීමේ අපහසුතාවයට විසඳුමක් වශයෙන් නැනෝතාක්ෂණය භාවිතා කොට දූවිලි සහ වෙනත් සියුම් අපද්‍රව්‍ය නොරැඳී ඉබේම පිරිසිදු වන වීදුරු වර්ග යක් නිෂ්පාදනය කර ඇත. මේවා කර්මාන්ත අංශයේ නැනෝතාක්ෂණය යොදාගන්නා ආකාරය සඳහා ඇති උදාහරණ කිහිපයක් පමණි.

### නැනෝතාක්ෂණය උදෙසා ජාතික මට්ටමේ පියවර

කර්මාන්ත අංශයේ සංවර්ධනය සඳහා නැනෝතාක්ෂණයේ ඇති වැදගත්කම සලකා රජය විසින් 2007 වසරේ දී නැනෝතාක්ෂණික උද්‍යානයක් ගොඩනැගීමට තීරණය කරන ලදී. මෙම මූලික පියවරේ අරමුණ වූයේ ලොව වටා විශාල වෙනස්කම් රැසක් ඇති කරමින් පැවැති නැනෝතාක්ෂණය වඩා වාසිදායක අන්දමින් යොදා ගැනීම සඳහා පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමයි. 2008 වසරේ දී, මෙම තාක්ෂණය කල් ඇතිව යොදා ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින් පෞද්ගලික අංශය විසින් මෙම ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට ඇඩි උනන්දුවක් දැක්වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් රජය හා එක්ව ශ්‍රී ලංකා නැනෝතාක්ෂණික ආයතනය (SLINTec) ගොඩනගන ලදී. රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් වන SLINTec ආයතනය විසින් ආර්ථික, පාරිසරික සහ සමාජයීය වශයෙන් යෝග්‍ය ව්‍යාපෘති සඳහා පමණක් පර්යේෂණ කටයුතු කිරීමට යොමු වී ඇත. පෙර වාර්තාගත ශ්‍රී ලංකාව අත්කරගත් වාර්ෂික අන්තර් ජාතික පේටන්ට් බලපත්‍ර අනුපාතය වන 1 - 1.5 හා සසඳන විට, SLINTec ආයතනය ක්‍රියාකාරී වූ පළමු වසරේ දීම අන්තර් ජාතික පේටන්ට් බලපත්‍ර 5 ක් හිමි කරගැනීමට සමත් වී ඇත. 2010 වසරේ ලබාගත් අන්තර් ජාතික පේටන්ට් බලපත්‍ර අතරේ නැනෝ කාබනික බට (Nano Carbon Tubes), නැනෝ පොහොර සහ නැනෝ රබර් ඇතුළත් වන අතර, මෙයින් ඇතැම් නිෂ්පාදිත වාණිජකරණයේ මුල් පියවරක් ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු දැනටමත් අරඹා ඇත. මේ අනුව, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු දැනට සිදුකර ඇති අංශ ලෙස රෙදිපිළි සහ ඇඟළුම් නිෂ්පාදිත, රබර් ආශ්‍රිත නිෂ්පාදිත, පොහොර සහ ග්‍රැනයිට් හා ඉල්මනයිට් වැනි ඛනිජ නිෂ්පාදිත අංශ දැක්විය හැක.

### නැනෝතාක්ෂණය යොදා ගතහැකි අවස්ථා සහ ඒ සඳහා ගෙන ඇති පියවර

අපනයන අභිමුඛ කරගත් ප්‍රධානතම කර්මාන්තශාලා නිෂ්පාදන කර්මාන්තය වන රෙදිපිළි සහ ඇඟළුම් අංශයෙහි නිෂ්පාදිත සඳහා මෙන්ම නිෂ්පාදන ක්‍රියාවලියේදී ද නැනෝතාක්ෂණය යොදා ගැනීම තුළින් නොයෙකුත් වාසි අත්කර ගත හැක. මේ අනුව, නැනෝ රෙදිපිළි ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කිරීමට අදාළව පර්යේෂණ හා සංවර්ධන කටයුතු කරන ලද අතර, මින් ඇතැම් නිෂ්පාදිත වාණිජකරණය සඳහා අවශ්‍ය මූලික කටයුතු වර්තමානයේ සිදු කෙරෙමින් පවතී. ඇඟළුම් නිෂ්පාදනයේ දී සහ ඇඟළුම් වර්ණගැන්වීමේ ක්‍රියාවලියේ දී බැහැර වන කාබනික අපද්‍රව්‍යයන්ගෙන් පරිසරයට වන හානිය අඩු කිරීමටත් නැනෝතාක්ෂණය යොදාගතහැකි අතර, මෙම සොයාගැනීම ද වාණිජකරණය සඳහා සංවර්ධනය කෙරෙමින් පවතී. මේ තුළින් දැනටමත් ශ්‍රී ලාංකේය ඇඟළුම් අපනයන හා බැඳි "හරිත අපනයන" යන වෙළෙඳ නාමයට සැලකිය යුතු අගය එකතු වීමක් සිදු වේ. ශ්‍රී ලංකාවට වාසිදායක අන්දමින් බලපාන තවත් නැනෝතාක්ෂණික සොයාගැනීමක් ලෙස වාණිජ බෝග වගාවට යොදා ගත හැකි නැනෝ පොහොර නම් කළ හැක. දැනට ක්ෂේත්‍ර අධ්‍යයන මට්ටමේ පවතින නැනෝ පොහොර සතු සුවිශේෂී ගුණාංගයක් වන්නේ එහි ඇති ඉහළ උරාගැනීමේ කාර්යක්ෂමතාවයයි. මේ ගුණාංගය හේතුවෙන් වගා කළ හැකි බිම් කොටසක් සඳහා අවශ්‍ය වන පොහොර ප්‍රමාණයේ අඩු වීමක් සිදුවේ. එමෙන්ම, දැනට අමුද්‍රව්‍ය ස්වරූපයෙන් අපනයන කරන ඛනිජ ද්‍රව්‍ය, කාබනික නැනෝ බට සහ නැනෝ ටයිටේනියම් ඩයොක්සයිඩ් බවට පරිවර්තනය කර අපනයනය කිරීමෙන් අපනයන ඉපැයීම්වල සැලකිය යුතු වැඩිවීමක් සිදුකළ හැක. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයන අභිමුඛ කර්මාන්තශාලා නිෂ්පාදන

කර්මාන්තය වන රබර් ආශ්‍රිත නිෂ්පාදිත කර්මාන්තයේ ද විදේශ විනිමය ඉපැයීම් සැලකිය යුතු අන්දමින් ඉහළ නැංවීමට ඝන ටයර් සහ රබර් අත්වැසුම් නිෂ්පාදනයේ දී නැනෝ රබර් යොදා ගත හැක.

**ඉදිරි දැක්ම**

මෙම කර්තව්‍යය ඉදිරියට ගෙන යාමේ දී මුහුණ පෑමට සිදු වූ එක් මූලික ගැටළුවක් වනුයේ ප්‍රමාණවත් අරමුදල් නොමැති වීමයි.

කෙසේ වුව ද, නැනෝතාක්ෂණික කර්මාන්තශාලා පිහිටුවීමට අවශ්‍ය වන ඉහළ ප්‍රාරම්භක වියදම, මෙමගින් ලැබෙන ඉහළ ආර්ථික ප්‍රතිලාභ හා ප්‍රතිලාභ ලබාගැනීමට ගතවන කෙටි කාලසීමාව සලකා බලා සාධාරණීකරණය කළ හැකිවේ. ඒ අනුව, නිසියාකාරව හා නිසිකාලීනව මෙම ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට පෞද්ගලික අංශය දැඩි ලෙස උනන්දු විය යුතුය. එමෙන්ම, රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ගොඩනැංවීම තුලින් රාජ්‍ය අයවැය මත ඇති බර අවම වන අතර නව සොයාගැනීම් වාණිජකරණය කිරීම වඩා ඉක්මන් කළ හැක.

**සැකසුම් කර්මාන්ත උප අංශය 2009 වසරේ දී පෙන් වූ සියයට 0.7 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 5.8 ක ධනාත්මක වර්ධනයක් පෙන්විය.** විශේෂයෙන් 2010 වසරේ මුල් මාස නවය තුළ තේ නිෂ්පාදනයේ ඇති වූ සතුටුදායක වර්ධනය සහ රබර් නිෂ්පාදනයේ ඉහළ යාම සැකසුම් උප අංශයේ එකතු කළ වටිනාකමෙහි හිතකර වර්ධනයට හේතු විය. නමුත් පොල් නිෂ්පාදනය සංකෝචනය වීම මෙම වර්ධනය මත අහිතකර අන්දමේ බලපෑමක් ඇති කළේය.

**2009 වසරේ දී සියයට 3.3 ක් වූ ගෘහ කර්මාන්ත උප අංශයෙහි වර්ධනය 2010 වසරේ දී සියයට 5.5 දක්වා ඉහළ ගොස් ඇත.** ඉහළ වී නිෂ්පාදනයත් සමඟ සහල් මෝල් ක්‍රියාකාරකම් සඳහා ඉල්ලුම ඉහළ යෑම, කුඩා පරිමාණ ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදන සඳහා ඉල්ලුම වැඩි වීම සහ ස්වයං රැකියා කටයුතු ප්‍රසාරණය වීම මෙම උප අංශයෙහි වර්ධනයට හේතු විය.

**විදුලිය, ගෑස් සහ ජලය උප අංශය 2009 වසරේ දී පෙන් වූ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 7.8 ක ඉහළ වර්ධනයක් වාර්තා කළේය.** උප අංශ තුනෙහිම කඩිනම් ක්‍රියාකාරිත්වය සමඟ මෙම සැලකිය යුතු වර්ධනය කරා ළඟා වීමට හැකි විය. මෙම අංශයට විශාලම දායකත්වයක් සපයන විදුලිය උප අංශය සියයට 8.2 කින් වර්ධනය විය. තාප විදුලිබල ජනනය සඳහා වූ ඉල්ලුම පහළ වැටුණ ද යහපත් කාලගුණික තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ජල විදුලිබල ජනනය වැඩි වීම මෙම වර්ධනයට හේතු විය. මෙම ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින් මුළු විදුලිබල ජනනය තුළ ජල විදුලියේ සාපේක්ෂ දායකත්වය 2009 වසරේ පැවැති සියයට 39.3 ට සාපේක්ෂව 2010 වසරේ සියයට 52.6 ක් දක්වා වැඩි විය. මේ අතර, ආර්ථිකයේ වර්ධන ක්‍රියාකාරීත්වය දක්වමින් ගෘහසස්ථ, වාණිජ සහ කාර්මික අංශයන් වෙතින් ඇති වූ විදුලිබලය සඳහා වූ ඉල්ලුම ද වැඩි විය. 2009 වසරේ දී සියයට 5.4 ක ප්‍රසාරණයක් පෙන්වූ ගෑස් උප අංශය 2010 වසරේ දී සියයට 4.6 ක වර්ධනයක් පෙන්විය. ඉකුත් වසරේ දී සියයට 2.9 කින් වර්ධනය වූ ජලය උප අංශය මෙම වසරේ දී සියයට 4.5 කින් අඛණ්ඩව වර්ධනය විය.

**ඉදිකිරීම් උප අංශයේ එකතු කළ අගය 2009 වසරේ දී වාර්තා කළ සියයට 5.6 ක අඩු වර්ධනය සමඟ සැසඳීමේ දී 2010 වසරේ දී සියයට 9.3 කින් සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය.** 2010 වසරේ දී දේශීයව නිෂ්පාදිත ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රමාණය සියයට 12.0 කින් වර්ධනය වීම තුළින් ඉදිකිරීම් කටයුතුවල ඉහළ යාම විදහා දැක්වේ. තවදුරටත්, වෙළෙඳපොළෙහි පැවැති සිමෙන්ති ප්‍රමාණය පෙර වසරේ දී වාර්තා කළ සියයට 11.1 ක සංකෝචනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 18.1 කින් වර්ධනය විය. 2010 වසරේ දී ඉදිකිරීම් අරමුණු උදෙසා පෞද්ගලික අංශය වෙත නිකුත් කළ ණය ප්‍රමාණය සියයට 19.3 කින් වර්ධනය වීම තුළින් ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා පෞද්ගලික අංශයෙහි නැඹුරුව පෙන්නුම් කෙරේ. මේ අතර, රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක කළ මහාමාර්ග, වරාය, බලශක්ති, වාරිමාර්ග හා ජල සම්පාදන සහ නිවාස ආශ්‍රිත ඉදිකිරීම් ව්‍යාපෘති මෙන්ම සුළු පරිමාණ ඉදිකිරීම් කටයුතු ද ඉදිකිරීම් අංශයෙහි එකතු කළ අගයෙහි වර්ධනය උදෙසා සුබදායී ලෙස දායක විය. අධිවේගී මාර්ග, අන්තර් පළාත් මහා මාර්ග වැනි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග අංශයේ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සහ ඉහළ යන බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා ක්‍රියාත්මක වන මහා පරිමාණ බලශක්ති ව්‍යාපෘති හේතුවෙන් ඉදිකිරීම් අංශය ප්‍රසාරණය විය. එසේම, වරාය සංවර්ධන ව්‍යාපෘති ද මෑතක දී මුදාගත් ප්‍රදේශවල නිවාස ඉදිකිරීම් හා වෙනත් ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ඉදිකිරීම් අංශයේ කටයුතු වේගවත් විය.

### සේවා අංශය

**ද.දේ.නි යට සියයට 59.3 ක දායකත්වයක් සැපයූ සේවා අංශය 2010 වසරේ දී සියයට 8.0 ක වර්ධනයක් වාර්තා කළේය.** 2010 වසරේ දී ළඟාකරගත් මෙම ඉහළ වර්ධනය ප්‍රධාන වශයෙන්ම 2009 වසරේ දී සංකෝචනය වූ වෙළෙඳ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පැමිණීම මගින් ඇති වූවකි. මේ අතර, හෝටල් සහ ආපනශාලා මෙන්ම ප්‍රවාහන යන උප අංශ ද මෙම වසරේ දී ඵලදායී වර්ධනයක් පෙන්වීය.

**2010 වසර තුළ දී තොග සහ සිල්ලර වෙළෙඳාම් අංශය අත්කරගත් සියයට 7.5 ක වර්ධනය මගින් එම අංශයෙහි ප්‍රසාරණය දැක්විණි.** එසේම, පෙර වසරේ දී වර්ධනයට සෘණාත්මකව බලපෑ මෙම අංශය 2010 වසරේ දී ද.දේ.නි. වර්ධනයට සියයට 21.7 කින් දායක විය. ජාත්‍යන්තර වෙළෙඳපොළ ක්‍රමිකව යථාතත්ත්වයට පත්වීමත් සමඟ පෙර වසරේ අඩපණ වූ ආනයන හා අපනයන වෙළෙඳ කටයුතු වේගවත් වූ අතර දේශීය වෙළෙඳ කටයුතුවල සිදු වූ වර්ධනයද මෙම අංශයේ වැඩිදියුණුවට ධනාත්මකව බලපාන ලදී.

**ආනයන වෙළෙඳාම් උප අංශයේ එකතු කළ අගය, 2009 වසරේ දී වාර්තා කළ සියයට 8.2 ක සංකෝචනය සමඟ සැසඳීමේ දී 2010 වසරේ දී සියයට 9.5 කින් වර්ධනය විය.** ආහාර ද්‍රව්‍ය සහ මෝටර් රථ වාහන වැනි වෙනත් පාරිභෝගික භාණ්ඩ ඇතුළත් පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ පරිමාව සියයට 20.6 කින් වර්ධනය වීම තුළින් මෙම උප අංශයෙහි වර්ධනය දැක්විණි. රෙදිපිළි සහ බොර තෙල් ආනයනය අඩු අගයක පැවතිය ද අන්තර් භාණ්ඩ ආනයනය සියයට 13.0 කින් වර්ධනය විය. වසර තුළ වෙනත් ඛනිජ තෙල් ආනයන, පොහොර සහ වෙනත් ආනයන ඉහළ යෑම ප්‍රධාන වශයෙන් මෙම කාණ්ඩයේ පරිමාව වර්ධනයට හේතු විය. මේ අතර, ගමනාගමන සහ යන්ත්‍ර සූත්‍ර උපකරණ ආනයනය වැඩි වීම සමඟ ආයෝජන භාණ්ඩ ආනයන පරිමාව සියයට 7.3 කින් වර්ධනය විය.

**පෙර වසරේ දී සියයට 2.2 කින් සංකෝචනය වූ අපනයන වෙළෙඳාම් උප අංශය ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි වූ සංවර්ධනයේ ප්‍රතිලාභ ලබමින් 2010 වසරේ දී සියයට 3.4 ක වර්ධනයක් වාර්තා කළේය.** ප්‍රධාන වශයෙන්ම තේ සහ වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන පිළිවෙළින් සියයට 11.4 කින් සහ සියයට 20.1 කින් ප්‍රසාරණය වීම හේතුවෙන් මෙම අංශය තුළ කෘෂිකාර්මික අපනයන සියයට 9.7 කින් වර්ධනය විය. 2010 වසරේ දී රෙදිපිළි සහ ඇඟළුම් අපනයන පහත වැටුණ ද ඛණිජ තෙල් නිෂ්පාදන සහ අනෙකුත් කාර්මික අපනයන මෙම අංශයෙහි වර්ධනය තවදුරටත් පවත්වා ගැනීමට උපකාරී විය. එසේම, ඛණිජ ද්‍රව්‍ය අපනයන පරිමාවේ ඉකුත් වසරේ දී පැවැති සියයට 8.8 ක සංකෝචනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 3.0 කින් ප්‍රසාරණය විය.

**දේශීය වෙළෙඳාම් උප අංශය 2009 වසරේ දී අත්කරගත් සියයට 7.3 ක වර්ධනය සමඟ සැසඳීමේ දී 2010 වසරේ දී සියයට 7.6 ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කළේය.** මෙය රට තුළ සාමය ප්‍රතිස්ථාපනය වීමත් සමඟ රටේ සෑම පළාතකම ආර්ථික කටයුතු උද්දීපනය වීමෙන් දේශීය ඉල්ලුම වේගවත් වීමේ ප්‍රතිඵලයකි.

**රට තුළ පැවැති සාමකාමී පරිසරය හේතුවෙන් හෝටල් සහ ආපනශාලා අංශය 2009 වසරේ දී වාර්තා කළ සියයට 13.3 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 39.8 ක ආකර්ෂණීය වේගයකින් වර්ධනය විය.** 2009 වසරේ දී වූ සියයට 2.1 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 46.1 කින් වර්ධනය වූ සංචාරකයන්ගේ පැමිණීම වැනි සංචාරක කර්මාන්තය ආශ්‍රිත දර්ශක තුළින් දේශීය හා විදේශීය සංචාරක කටයුතුවල වේගවත් වීම පිළිබිඹු විය. තව ද, දේශීය හා විදේශීය දෙඅංශයම ඇතුළත් සංචාරක රාත්‍රී සංඛ්‍යාව ද සියයට 42.3 කින් වර්ධනය විය.

**ප්‍රවාහන සහ සන්නිවේදන උප අංශය 2009 වසරේ දී ලබාගත් සියයට 6.3 ක වර්ධනයට සාපේක්ෂව 2010 දී සියයට 11.9 කින් වර්ධනය විය.** ප්‍රවාහන, භාණ්ඩ මෙහෙය වීම - වරාය සහ සිවිල් ගුවන් සේවා හා තැපැල් සහ විදුලි සංදේශ යන උප අංශ තුනෙහි වූ හිතකර වර්ධනය මෙමගින් සනාථ විය.

**ප්‍රවාහන උප අංශය ඉකුත් වසර තුනක කාල සීමාව තුළ ඉහළම වර්ධන වේගය වාර්තා කරමින් 2010 වසරේ දී සියයට 11.4 කින් වර්ධනය විය.** බස් රථ සමාගම්වල වාර්තා වූ මගී කිලෝ මීටර ප්‍රමාණයෙහි ප්‍රසාරණය මගින් මෙම සැලකිය යුතු වර්ධනය පිළිබිඹු කෙරිණි. ප්‍රවාහන සේවය සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම තුළ ඉන්ධන පරිභෝජනය වැඩි වූ අතර, වසර තුළ මිල ගණන් සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි. පෙට්‍රල් සහ ඩීසල් විකුණුම් පරිමාව, පිළිවෙළින් සියයට 14.3 කින් සහ සියයට 1.2 කින් වැඩි වීම මගින් ඉන්ධන පරිභෝජනයෙහි වර්ධනය පෙන්නුම් කෙරිණි. රථවාහන ආනයනය සඳහා වූ තීරුබදු අඩු කිරීමේ සංශෝධනය සමඟම නව වාහන ලියාපදිංචි කිරීම ද 2010 වසරේ සියයට 76.0 කින් වැඩි විය. සංචාරක කර්මාන්තයෙහි කැපී පෙනෙන ප්‍රගමනයත් සමඟ ගුවන් සේවා උප අංශය ද ශීඝ්‍රව වර්ධනය විය.

**භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා උප අංශය 2009 වසරේ දී වාර්තා වූ සියයට 0.4 ට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 16.8 කින් සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය.** 2010 වසර තුළ දී ප්‍රතිනැව්ගතකරණය සහ දේශීයව භාණ්ඩ හැසිරවීම පිළිවෙළින් සියයට 18.0 කින් සහ සියයට 26.7 කින් වර්ධනය වීම මෙම ප්‍රසාරණයට දායක විය. තව ද, 2010 වසරේ දී කොළඹ වරාය මගින් හසුරුවන ලද භාණ්ඩ පරිමාව අඩි විස්සට සමාන බහාලුම් ඒකක (TEUs) මිලියන 4.1 ක් ලෙස වාර්තා ගත ඉහළම අගය දැක්වීය.

**සමස්ත වර්ධනයට සතුටුදායක දායකත්වයක් සැපයූ තැපැල් සහ විදුලි සංදේශ අංශය 2010 වසරේ දී සියයට 13.2 කින් අඛණ්ඩව වර්ධනය විය.** සන්නිවේදන ග්‍රාහක පදනම 2010 වසරේ දී සියයට 17.6 කින් ඉහළ යාම මගින් මෙම වර්ධනය පිළිබිඹු විය. ස්ථාවර සංකේත විභේදුම් බහුවිධ ප්‍රවේශ තාක්ෂණ (CDMA) ඇතුළත් ස්ථාවර දුරකථන ග්‍රාහක පදනම සියයට 3.9 කින් වර්ධනය වූ අතර මෙම අංශය පුළුල් වීම මගින් ඇති වූ ප්‍රවේශ වීමේ හැකියාව හා ගාස්තු දැරිය හැකි මට්ටමේ පැවතීමෙන් ඇති වූ ප්‍රගතිය පෙන්නුම් කරමින් ජංගම දුරකථන ග්‍රාහකයින් සංඛ්‍යාව මිලියන 17.2 ක් දක්වා සියයට 20.9 කින් වැඩි විය. නවීන තාක්ෂණය භාවිතයෙන් අනෙකුත් සන්නිවේදන අංශයන්හි ඇති වූ දියුණුවත් සමග තැපැල් සේවාවන්හි ක්‍රියාකාරිත්වය මන්දගාමී විය.

**බැංකු කටයුතු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යන උප අංශය 2009 වසරේ දී වාර්තා කළ සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව 2010 දී සියයට 7.5 කින් ප්‍රසාරණය විය.** අඩු මට්ටමක පැවැති පොලී අනුපාත හේතුවෙන් ණය සහ අත්තිකාරම් සැපයීම හා වෙනත් ආයෝජන මගින් ලද ආදායම් තුළින් ලද දායකත්වය ඉහළ යාම සහ එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ පෞද්ගලික අංශය වෙත සැපයෙන ණය ප්‍රමාණය වැඩි වූ අතර, බැංකු අංශයේ විදේශ විනිමය වෙළෙඳ කටයුතුවල ද පැවැති ඉහළ ක්‍රියාකාරිත්වය තුළින් බැංකු අංශයේ ලාභාදායීත්වය ඉහළයාම මෙම ආංශික වර්ධනයට දායක විය. එසේම, නව ශාඛා හා සේවා කවුළු විවෘත කිරීම හරහා මූල්‍ය සේවා පුළුල් වීම සහ අනෙකුත් සේවා සැපයීම ද අඛණ්ඩව සිදු විය. මේ අතර, නව වාහන ලියාපදිංචි කිරීම වැඩි වීම වැනි සංශෝධනයන් හමුවේ රක්ෂණ සහ කල්බදු අංශ ද සැලකිය යුතු ලෙස වර්ධනය විය. දේපළ වෙළෙඳාම් අංශය ද මෙම කාලපරිච්ඡේදය තුළ එහි තරගකාරී තත්ත්වය පවත්වා ගෙන යාමට හැකි විය.

**රාජ්‍ය සේවා උප අංශය 2009 වසරේ දී වාර්තා කළ සියයට 5.9 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 5.4 ක අඩු වර්ධනයක් වාර්තා කළේය.** රාජ්‍ය සේවාවන් වැඩිදියුණු වීම සහ පුළුල් වීම මෙම අංශයෙහි වර්ධනයට දායක විය.

**පෞද්ගලික සේවා උප අංශය පෙර වසරේ දී මෙන් 2010 වසර තුළ ද සියයට 5.8 ක වර්ධනයක් පෙන්වීය.** පෞද්ගලික අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවන් ද ආර්ථික කටයුතුවල පිබිදීමත් සමග අනෙකුත් පෞද්ගලික අංශයේ සේවාවන් ද වර්ධනය වූ අතර එමගින් මෙම අංශයේ වර්ධනය උද්දීපනය විය.

## 2.3 වියදම

**පරිභෝජන සහ ආයෝජන වශයෙන් වූ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මගින් ජනිත වන සමස්ත ඉල්ලුම මැන බැලෙන දළ දේශීය වියදම (ද.දේ.වි.) 2010 වසරේ දී රුපියල් බිලියන 6,114 ක් ලෙස ඇස්තමේන්තු කෙරිණි.** එබැවින් දළ දේශීය වියදමින් දැක්වෙන සමස්ත ඉල්ලුම 2009 වසරේ වාර්තා වූ සියයට 2.7 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ සියයට 18.7 කින් වර්ධනය විය. තව ද, පරිභෝජන සහ ආයෝජන ආර්ථික ක්‍රියාකාරකම්වල පෙර වසරේ පැවැති මන්දගාමී තත්ත්වයට සාපේක්ෂව 2010 වසරේ දී ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු වීම, දළ දේශීය වියදම ඉහළ යාම මගින් පිළිබිඹු විය. රටේ පැවැති සාමකාමී වාතාවරණය සහ මුදාගත් ප්‍රදේශවලින් ඇති වූ ආයෝජන සහ පරිභෝජන ඉල්ලුම යන කරුණුවලින් ඇති වූ ධනාත්මක බලපෑම මෙලෙස දේශීය ඉල්ලුම වැඩි වීමට හේතු විය හැකිය. වෙළෙඳ මිල අනුව ද.දේ.නි. එනම් ශුද්ධ අපනයනවලට ගලපන ලද දළ දේශීය වියදම 2010 වසරේ රුපියල් බිලියන 5,602 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, මෙය 2009 වසරට සාපේක්ෂව සියයට 15.9 කින් වැඩි වීමකි. මූර්ත වශයෙන් ද.දේ.නි. සියයට 8.0 කින් වැඩි වීමත් ද.දේ.නි. අවධමනකය මගින් ගම්‍ය වන මිල මට්ටම සියයට 7.3 කින් ඉහළ යෑමත් උක්ත වැඩි වීම තුළ අන්තර්ගත විය.

### පරිභෝජනය

**පෞද්ගලික සහ රාජ්‍ය අංශය යන දෙඅංශයම අයත් වන පරිභෝජන වියදම 2010 වසරේ රුපියල් බිලියන 4,557 ක් ලෙස සියයට 14.9 කින් වර්ධනය විය.** 2009 වසරේ දී සමස්ත පරිභෝජන වියදමේ වූ සියයට 4.4 ක නාමික වර්ධනය හා සැසඳීමේ දී එම වසරේ පැවැති පසුගාමී තත්ත්වයේ සිට ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු වෙමින් නැවත යථා තත්ත්වයට පත් වීම පරිභෝජන වියදමේ මෙම වර්ධනය මගින් පිළිබිඹු වේ.

මේ අතර, පෞද්ගලික සහ රජය යන දෙඅංශයේ පරිභෝජන වියදම 2010 වසරේ පිළිවෙළින් සියයට 18.2 කින් සහ සියයට 2.5 කින් වර්ධනය විය. මේ අතර, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික පරිභෝජන වියදම 2009 වසරේ දී පැවැති සියයට 64.4 ක අනුපාතිකයට සාපේක්ෂව 2010 වසරේ සියයට 65.8 ක ඉහළ දායකත්වයක් දැක්වීය. එසේම, 2009 වසරේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 17.6 ක් වූ රජයේ පරිභෝජන වියදම 2010 වසරේ දී සියයට 15.6 දක්වා පහළ ගිය අතර එමගින් පෞද්ගලික අංශයේ ඉහළ වර්ධන ගාමකත්වය පිළිබිඹු විය.

**පෞද්ගලික පරිභෝජන වියදමේ විශාලතම අයිතමය වන ආහාර, පාන සහ දුම්කොළ 2010 වසරේ සමස්ත පෞද්ගලික පරිභෝජන වියදම සඳහා සියයට 39.6 ක දායකත්වයක් දැක්වීය.** එසේම මෙම අංශය මත වූ වියදම පෙර වසරේ සියයට 2.1 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ සියයට 22.6 කින් වැඩි විය. විශේෂයෙන්ම, උතුරු නැගෙනහිර පළාත් වලින් ජනිත වූ වැඩි ඉල්ලුම මෙලෙස සමස්ත ඉල්ලුම ඉහළ යාමට දායක විය. එසේම, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද.) පවතින උප දර්ශකයෙන් දැක්වෙන පරිදි මෙම පරිභෝජන අංශයේ සාමාන්‍ය මිල මට්ටම 2009 වසරේ වූ සියයට 2.8 ක සාපේක්ෂව පහළ අගයක සිට 2010 දී සියයට 6.8 ක් දක්වා ඉහළ ගියේය. එසේම, රෙදිපිළි සහ පාවහන් මත වූ වියදම සියයට 26.2 කින් වැඩි වූ අතර, එය 2009 වසරේ ලබාගත් සියයට 1.1 ක ඌන වර්ධනයෙන් මිදී නැවත යථා තත්ත්වයට පත්වීමකි.

**නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන සඳහා වූ පෞද්ගලික වියදම පෙර වසරේ පැවැති සියයට 4.7 ට සාපේක්ෂව 2010 දී සියයට 10.7 කින් වැඩි විය.** සමස්තයක් වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමත් සමඟ පැන නැගුණු ඉල්ලුමේ වැඩි වීම හේතුවෙන් කො.පා.මි.ද. උප දර්ශකයට අනුව මිල ගණන් ද සියයට 3.4 කින් වැඩි විණි. නමුත්, ඉන්ධන සහ විදුලිය වැනි බොහෝ අයිතමවල මිල ගණන් වසර තුළ නොවෙනස්ව පැවතිණි.

**මේ අතර, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ සහ නෛත්‍යක නිවාස නඩත්තු කටයුතු මත වූ වියදමේ නාමික වටිනාකම පෙර වසරේ පැවැති සියයට 3.6 ක වූ අගයට සාපේක්ෂව 2010 දී සියයට 3.9 කින් වර්ධනය විය.** පරිභෝජන වියදමෙහි මෙම වියදම් කාණ්ඩයේ සාපේක්ෂ දායකත්වය 2009 වසරේ දී සියයට 5.9 ක මට්ටමක සිට 2010 දී සියයට 5.2 ක් දක්වා අඩු විය.

**පෞද්ගලික පරිභෝජන වියදමට අයත් සෞඛ්‍ය සහ අධ්‍යාපනය මත වූ වියදම 2009 වසරේ පිළිවෙළින් සියයට 21.0 සහ සියයට 9.9 ක වර්ධනය සැසඳීමේ දී 2010 වසරේ පිළිවෙළින් සියයට 7.9 කින් හා සියයට 12.3 කින් ප්‍රසාරණය විය.** කෙසේ වෙතත්, සෞඛ්‍ය සහ අධ්‍යාපනය සම්බන්ධ වියදම්වල සාපේක්ෂ දායකත්වය පිළිවෙළින් සියයට 2.0 ක් සහ සියයට 0.1 ක් ලෙස පහළ මට්ටමක පැවතුණු අතර, මහජනතාවට මෙම සේවාවන් ලබා දීමට රජයේ ඇති දායකත්වය මෙමගින් පිළිබිඹු වේ.

**2.11 සංඛ්‍යා සටහන**

**සමස්ත ඉල්ලුම**

රුපියල් මිලියන

| අයිතමය | පවත්නා වෙළෙඳ මිල අනුව | | | 2002 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 (අ) | 2010 (ආ) | 2008 | 2009 (අ) | 2010 (ආ) |
| 1. දේශීය ඉල්ලුම | | | | | | |
| පරිභෝජනය | 3,799,084 | 3,967,770 | 4,557,348 | 1,922,863 | 1,992,820 | 2,160,814 |
| (% වෙනස) | 28.8 | 4.4 | 14.9 | 7.9 | 3.6 | 8.4 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1,215,247 | 1,181,449 | 1,556,769 | 657,377 | 671,191 | 775,400 |
| (% වෙනස) | 21.5 | -2.8 | 31.8 | 4.2 | 2.1 | 15.5 |
| **මුළු දේශීය ඉල්ලුම** | **5,014,331** | **5,149,220** | **6,114,117** | **2,580,240** | **2,664,011** | **2,936,214** |
| **(% වෙනස)** | **26.9** | **2.7** | **18.7** | **6.9** | **3.2** | **10.2** |
| 2. විදේශීය ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 1,095,679 | 1,031,289 | 1,215,007 | 758,972 | 665,575 | 703,917 |
| (% වෙනස) | 5.2 | -5.9 | 17.8 | 0.4 | -12.3 | 5.8 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 1,699,328 | 1,345,216 | 1,726,803 | 973,711 | 880,372 | 994,699 |
| (% වෙනස) | 20.2 | -20.8 | 28.4 | 4.0 | -9.6 | 13.0 |
| **ශුද්ධ බාහිර ඉල්ලුම** | **-603,649** | **-313,927** | **-511,796** | **-214,739** | **-214,797** | **-290,782** |
| **3. මුළු ඉල්ලුම** | **4,410,682** | **4,835,293** | **5,602,321** | **2,365,501** | **2,449,214** | **2,645,432** |
| **(% වෙනස)** | **23.2** | **9.6** | **15.9** | **6.0** | **3.5** | **8.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.12 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය**

| අයිතමය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට ආයකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009(අ) | 2010 (ආ) | 09/08 | 10/09 |
| 1. ආහාර, පාන සහ දුම්කොළ | 37.8 | 38.2 | 39.6 | 2.1 | 22.6 |
| 2. රෙදිපිළි සහ පාවහන් | 5.7 | 5.6 | 6.0 | -1.1 | 26.2 |
| 3. නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන | 12.7 | 12.0 | 11.2 | -4.7 | 10.7 |
| 4. ගෘහභාණ්ඩ, ගෘහස්ථ උපකරණ සහ නෛත්‍යක නිවාස නඩත්තුව | 5.8 | 5.9 | 5.2 | 3.6 | 3.9 |
| 5. සෞඛ්‍යය | 1.8 | 2.2 | 2.0 | 21.0 | 7.9 |
| 6. ප්‍රවාහනය | 21.8 | 21.1 | 21.2 | -2.1 | 19.0 |
| 7. විනෝද සේවා සහ සංස්කෘතික කටයුතු | 3.6 | 2.9 | 2.5 | -18.1 | 0.9 |
| 8. අධ්‍යාපනය | 0.1 | 0.1 | 0.1 | 9.9 | 12.3 |
| 9. හෝටල් සහ ආපනශාලා | 1.5 | 1.5 | 1.3 | 2.7 | 4.7 |
| 10. විවිධ භාණ්ඩ සහ සේවා | 4.9 | 5.5 | 4.8 | 14.4 | 3.0 |
| 11. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 7.7 | 8.1 | 9.2 | 5.9 | 34.8 |
| 12. අඩු කළා : විදේශිකයින් මෙතෙරදී කරන වියදම් | 3.3 | 3.1 | 3.1 | -5.0 | 20.8 |
| **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.0** | **100.0** | **100.0** | **1.0** | **18.2** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**පෞද්ගලික පරිභෝජන වියදම තුළ ප්‍රවාහන කටයුතු සඳහා වන සාපේක්ෂ ආයකත්වය 2010 වසර තුළ සියයට 21.2 කින් වැඩි වූ අතර මෙය පෙර වසරට සාපේක්ෂව ආන්තික ඉහළයාමකි.** 2009 වසරේ දී පැවැති සියයට 2.1 ක සංකෝචනයෙන් මිදී 2010 වසර තුළ ප්‍රවාහන කටයුතු සඳහා වූ වියදම සියයට 19.0 කින් වැඩි විය. පොදු ප්‍රවාහන කටයුතු සහ ඉන්ධනවල මිල ගණන් 2010 වසර තුළ නොවෙනස්ව පැවතීම හේතුවෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ මිල වෙනස්වීම් මත වූ බලපෑම ආන්තික වූ අතර මෙම අංශයේ වර්ධනය රටේ පැවතුණු සාමකාමී වාතාවරණය හමුවේ මූර්ත වශයෙන් ඇති වූ වර්ධනයකි.

**රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම 2009 වසරේ දී පැවැති සියයට 19.3 ක වර්ධන අනුපාතයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 2.5 කින් වැඩි විය.** රජයේ වියදම් තාර්කිකරණය හේතුවෙන් අනෙකුත් වර්තන වියදම්වල අඩු වීම මීට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර වැටුප් හා වේතන මත වූ වියදම මෙම වසර තුළ දී ඉහළ ගියේය.

## ආයෝජනය

**පෙර වසරේ සියයට 2.8 කින් සංකෝචනය වූ ආයෝජන සඳහා වූ වියදමේ නාමික වටිනාකම (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) නැවත යථා තත්ත්වයට පත්වෙමින් 2010 වසරේ සියයට 31.8 කින් ප්‍රසාරණය විය.** එසේම, ආයෝජන වියදම 2009 වසරේ පැවැති රුපියල් බිලියන 1,181 ක සිට රුපියල් බිලියන 1,557 ක් දක්වා 2010 වසරේ දී වැඩි විය. පෙර වසරේ පහළ මට්ටමක තිබූ ආයෝජන ක්‍රියාකාරකම් මෙම වසරේ දී යහපත් ආර්ථික වාතාවරණය හමුවේ ඉහළ මට්ටමකට වර්ධනය විය. ආයෝජන ක්‍රියාකාරකම් මෙලෙස යථා තත්ත්වයට පැමිණීම මූර්ත වටිනාකම වැඩි වීම මගින් ද පිළිබිඹු වූ අතර, 2009 වසරේ ලබාගත් සියයට 2.1 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී ලැබූ සියයට 15.5 ක වර්ධනය මීට සාක්ෂි දැරීය. එසේම, ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස නාමික ආයෝජන වියදම දැක්වෙන ආයෝජන අනුපාතය පෙර වසරේ වූ සියයට 24.4 ක සිට 2010 දී සියයට 27.8 ක් දක්වා වර්ධනය විය.

**2009 වසරේ සියයට 7.1 ක සැලකිය යුතු මට්ටමකින් සංකෝචනය වූ පෞද්ගලික ආයෝජන ක්‍රියාකාරකම් 2010 වසරේ දී සියයට 40.1 ක අගයකින් නාමිකව වර්ධනය වෙමින් නැවත යථා තත්ත්වයට පත් විය.** රාජ්‍ය සංස්ථා ඇතුළත් පෞද්ගලික අංශයේ ආයෝජන 2010 වසරේ සමස්ත ආයෝජනයෙන් සියයට 77.7 ක කොටසක් නියෝජනය කළේය. දේශීය සහ විදේශීය ආර්ථිකයන්හි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් 2009 වසරේ දී පහළ වැටුණු පෞද්ගලික ආයෝජන මෙම වසරේ දී එම අංශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ඉහළ පෙළඹුම් සහිත වූ මනා ක්‍රියාකාරිත්වයකින් යුතු ආර්ථික පරිසරයක් තුළ නැවතත් යථා තත්ත්වයට පත් විය. වසරේ අග භාගයේ වේගයෙන් වර්ධනය වූ පෞද්ගලික අංශයේ ණයවල ක්‍රියාකාරිත්වය ඉහළ යාම මගින් මෙම තත්ත්වය

පිළිබිඹු කෙරිණි. එසේම ආයෝජන භාණ්ඩ ආනයනය එ.ජ.ඩොලර් මිලියන 2,970 ක් දක්වා ඉහළ යාම වසර තුළ ආයෝජන ක්‍රියාකාරකම්වල ප්‍රසාරණය සනිටුහන් කළේය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු සෘජු විදේශ ආයෝජන වටිනාකම 2009 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 601 ට සාපේක්ෂව 2010 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 516 ක් දක්වා සියයට 14 කින් අඩු විය.** මෙම සෘජු විදේශ ආයෝජන ප්‍රධාන වශයෙන් නිෂ්පාදන, කෘෂිකාර්මික හා යටිතල පහසුකම් අංශ වෙත යොමු වූ අතර, මුළු සෘජු විදේශ ආයෝජනවලින් සියයට 31 කට වඩා වැඩි ප්‍රතිශතයක් නිෂ්පාදන අංශය වෙත යොමු විය. නිෂ්පාදන අංශය තුළ රසායනික, ඛනිජ තෙල්, ගල් අඟුරු, ප්ලාස්ටික් නිෂ්පාදිත සහ රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත කාණ්ඩයන් විශාල ආයෝජන ප්‍රමාණයක් ආකර්ෂණය කර ගන්නා ලදි. එ.ජ.ඩොලර් මිලියන 110 ක් වූ ඉහළම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයක් ඉන්දියාවෙන් ලද අතර, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මැලේසියාව, එක්සත් රාජධානිය, සිංගප්පූරුව සහ හොංකොං යන රටවල් විසින් සැළකිය යුතු ආයෝජන ලැබී ඇත. 2010 වසර අවසානයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ දැනටමත් ලැබී ඇති ආයෝජන වටිනාකම රුපියල් බිලියන 861 ක් විය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 17 වන සහ 16 වන වගන්ති යටතේ 2009 වසරේ දී අනුමත කරන ලද ව්‍යාපෘති 422 ට සාපේක්ෂව 2010 වසරේ දී අනුමත කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 427 ක් විය.** 2010 වසරේ දී අනුමත කරන ලද ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 135 ක පූර්ණ අයිතිය විදේශීය ආයෝජකයන් සතු වූ අතර, ව්‍යාපෘති 183 ක අයිතිය දේශීය ආයෝජකයින් සතු විය. අනුමත කරන ලද ව්‍යාපෘතිවල ඇස්තමේන්තු ගත මුළු ආයෝජන වටිනාකම 2009 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 565 ට සාපේක්ෂව 2010 වසරේ දී රුපියල් බිලියන 299 ක් විය. ව්‍යාපෘති 266 ක් සහිතව සේවා අංශය ප්‍රධාන ආයෝජන ආකර්ශන අංශය බවට පත් විය. එමෙන්ම නිෂ්පාදන උප අංශය යටතේ ආහාර, පාන වර්ග, දුම්කොල නිෂ්පාදිත කාණ්ඩය ව්‍යාපෘති 31 ක් සමග ප්‍රධාන ආයෝජන කාණ්ඩය බවට පත් විය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 17 වන වගන්තිය යටතේ දේශීය සහ විදේශීය ආයෝජකයින් සමග ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් සිදු කරන ලද අතර, 2010 වසරේ දී අපනයන සැකසුම් කලාපවල පිහිටි ව්‍යාපෘති ගණනාවක වාණිජ කටයුතු ආරම්භ කරන ලදී.** 2009 වසරේ දී ආයෝජන මණ්ඩලයේ 17 වැනි වගන්තිය යටතේ පැවැති ව්‍යාපෘති 182 ක සම්පූර්ණ ආයෝජනය වූ රුපියල් බිලියන 423 ට සාපේක්ෂව 2010 වසරේ දී ව්‍යාපෘති 262 ක සම්පූර්ණ ආයෝජනය රුපියල් බිලියන 222 ක් දක්වා අඩු විය.

**2.13 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන්හි ආයෝජන සහ සේවා නියුක්තිය**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | ආයෝජන (රු. මිලියන) | | | | | | සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2009 (අ) | | | 2010 (ආ) | | | | |
| | 2009 (අ) | 2010 (ආ) | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | 2009 (අ) | 2010 (ආ) |
| ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරණ පනත යටතේ) | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 422 | 427 | 454,896 | 110,138 | 565,033 | 87,155 | 211,605 | 298,760 | 130,294 | 55,866 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 384 | 353 | 441,004 | 109,582 | 550,586 | 82,604 | 211,289 | 293,893 | 128,465 | 54,125 |
| 16 වන වගන්තිය යටතේ | 38 | 74 | 13,892 | 556 | 14,447 | 4,551 | 316 | 4,867 | 1,829 | 1,741 |
| 17 වන වගන්තිය යටතේ ගිවිස ගත් ව්‍යාපෘති (ඇ) | 182 | 262 | 374,029 | 48,875 | 422,904 | 55,318 | 166,336 | 221,654 | 109,382 | 33,099 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) | 2,283 | 1,991 | 495,506 | 278,762 | 774,268 | 533,312 | 327,766 | 861,078 | 477,530 | 461,813 |
| වාණිජ කටයුතුවල නිරත වූ (ඈ) | 2,633 | 2,587 | 264,899 | 3,913,854 | 4,178,755 | 267,702 | 3,923,546 | 4,191,247 | 405,991 | 390,242 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) (ඈ) | 1,848 | 1,830 | 245,383 | 3,903,491 | 4,148,875 | 248,417 | 3,913,263 | 4,161,680 | 368,846 | 354,144 |
| 16 වන වගන්තිය යටතේ (ඈ) | 785 | 757 | 19,516 | 10,363 | 29,880 | 19,285 | 10,283 | 29,567 | 37,145 | 36,098 |
| කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | | | | | | | | | | |
| ලියාපදිංචි වූ ව්‍යාපෘති (ඈ) | 1,876 | 1,940 | - | 139,120 | 139,120 | - | 145,295 | 145,295 | 292,168 | 294,242 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘතීන් ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය


මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

ආයෝජනවලින් වැඩි ප්‍රමාණයක් සේවා අංශය විසින් අත්කරගත් අතර, මෙම අංශයේ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 2010 වසරේ දී සියයට 64 කින් ව්‍යාපෘති 141 ක් දක්වා වැඩි විය. නිෂ්පාදන උප අංශය තුළ වැඩිම දායකත්වයක් දැක්වූ රෙදිපිළි, ඇඟළුම් කර්මාන්ත, සම් නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ යන කාණ්ඩයන් රුපියල් බිලියන 11 ක් වූ ඇස්තමේන්තුගත ආයෝජන ප්‍රමාණයක් වාර්තා කළේය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 17 වැනි වගන්තිය යටතේ වාණිජ කටයුතු ආරම්භ කළ සම්පූර්ණ ව්‍යාපෘතීන්හි වටිනාකම 2009 වසර අවසානයේ පැවැති රුපියල් බිලියන 4,149 ට සාපේක්ෂව 2010 වසර අවසානය වනවිට රුපියල් බිලියන 4,162 ක් දක්වා මද වශයෙන් ඉහළ ගියේය.

**කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර්මාන්ත සංඛ්‍යාව 2009 වසරේ පැවැති 1,876 ට සාපේක්ෂව 2010 වසරේ දී 1,940 ක් දක්වා වැඩි විය.** එමෙන්ම, මුළු ආයෝජන වටිනාකම 2009 වසර අවසානයේ පැවැති රුපියල් බිලියන 139 ට සාපේක්ෂව 2010 දී රුපියල් බිලියන 145 ක් දක්වා වැඩි විය. මෙම ලියාපදිංචි කර්මාන්ත අතරට රටෙහි සියළු දිස්ත්‍රික්කවල පිහිටි ව්‍යවසායයන් අයත් වූ අතර, මුළු රැකියා උත්පාදනයෙන් සියයට 88 ක් සහ මුළු ආයෝජනවලින් සියයට 90 ක් පමණ ආකර්ෂණය කර ගනිමින් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙක ඉහළම ආයෝජන ප්‍රමාණයක් අත් කර ගන්නා ලදී.

**2.4 රූප සටහන** — **අනුමතකළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි ආයෝජන (පුළුල් කරන ලද ව්‍යාපෘතීන් ද ඇතුළත්ව)**




(අ) මිහින් ලංකා පෞද්ගලික සමාගම සඳහා කරන ලද දේශීය ආයෝජන හැර

**රජයේ ආයෝජන 2010 වසරේ දී සියයට 9.2 කින් වැඩි විය.** මෙහිලා ප්‍රධාන වූයේ භෞතික යටිතල පහසුකම් පුළුල් කිරීම විෂයය කරගත් ගමනාගමන, වාරිමාර්ග, විදුලිබල හා බලශක්ති සහ ජල සම්පාදන වැනි අංශවල දැනට ක්‍රියාත්මක වන මහා පරිමාණ ව්‍යාපෘති වල අඛණ්ඩ වර්ධනයයි. කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය, කොළඹ පිටරවුම් මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය වැනි මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන් ද මීට ඇතුළත් විය. රටේ උතුරු කොටසේ නිදහස් කරගත් ප්‍රදේශවල පුනරුත්ථාපන වැඩසටහන්වලට සමගාමීව ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක විය. මීට අමතරව තුලිත ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කරගත් "මගනැගුම" සහ "ගමනැගුම" ආදී කුඩා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතින් ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. එසේම, සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘති ද වැඩිවිය. මීට අයත් වූයේ අධ්‍යාපනය, සෞඛ්‍යය හා පරිසරය වැනි අංශවල ක්‍රියාත්මක වූ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වේ. මෙම ව්‍යාපෘති තුළින් රටේ මානව සම්පතේ ඵලදායිතාවය වැඩි කිරීමත් ඒ තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමත් අරමුණු කෙරිණි.

### පවත්නා සම්පත් සහ උපයෝජනය

**රටේ පවත්නා සම්පත් ප්‍රමාණය 2009 වසරේ දී දැක්වූ සියයට 1.2 ක සාපේක්ෂ පහළ වර්ධනය හා සැසඳීමේ දී 2010 වසර තුළ නාමික වශයෙන් රුපියල් බිලියන 7,329 ක් දක්වා සියයට 18.6 කින් වර්ධනය විය.** ද.දේ.නි. යෙන් දැක්වෙන දේශීය සම්පත් ප්‍රමාණය සහ භාණ්ඩ හා සේවා ආනයනවල වටිනාකමින් දැක්වෙන විදේශ සම්පත් ප්‍රමාණය මගින් පවත්නා සම්පත් මැන දැක්වේ. 2010 වසරේ දී රුපියල් බිලියන 5,602 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති දේශීය සම්පත්, සමස්ත සම්පත් ප්‍රමාණයෙන් සියයට 76.4 ක් නියෝජනය කරනු ලබයි. මෙය පසුගිය

වසර හා සැසඳීමේ දී ප්‍රතිශතාංක දෙකක පමණ පහත වැටීමක් වන අතර, මෙමගින් 2010 වසර තුළ වැඩි දියුණු වූ ආර්ථික ක්‍රියාකාරකම් සමඟ විදේශීය සම්පත්වලට වූ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමස්ත සම්පත් ප්‍රමාණයෙහි විදේශ සම්පත්වල සාපේක්ෂ කොටස 2009 සියයට 21.8 ක සිට 2010 දී සියයට 23.6 ක් දක්වා වැඩි විය. එසේම, 2009 පැවැති 0.3 ක සංකෝචනයෙන් යථා තත්ත්වයට පත් වෙමින් පවත්නා සම්පත් මූර්ත වශයෙන් සියයට 9.3 කින් වැඩි විය. වසර තුළ මූර්ත වශයෙන් වර්ධනය වූ දේශීය නිමැවුම සහ විදේශීය ආනයන යන දෙකම පවත්නා සම්පත් ප්‍රමාණය ඉහළ නැංවීමට උපකාරී විය.

**පවත්නා සම්පත්වලින් වැඩිම ප්‍රතිශතයක් පෙර වසරේ පැවැති පරිදිම 2010 දී ද පරිභෝජනය සඳහා උපයෝජනය විය.** මුළු උපයෝජනය තුළ පරිභෝජනයේ සාපේක්ෂ දායකත්වය 2009 දී වූ සියයට 64.2 ක මට්ටම හා සසඳන විට මෙම වසරේ සියයට 62.2 ක් විය. පෙර වසරේ සියයට 18.6 ක්ව පැවැති මුළු උපයෝජනය තුළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රමාණය 2010 දී සියයට 19.8 ක් දක්වා වැඩි වීමෙන් මුළු උපයෝජනය තුළ පරිභෝජනයේ සාපේක්ෂ දායකත්වය අඩු විණි. එසේම, සම්පත් උපයෝජනය තුළ භාණ්ඩ සහ සේවා අපනයනයෙහි දායකත්වය 2010 දී සියයට 16.6 ක් විය.

**2.14 සංඛ්‍යා සටහන**
**සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළෙඳ මිල අනුව)**


| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|
| | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) |
| 1. **සම්පත්** | | | | |
| වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 78.2 | 76.4 | 9.6 | 15.9 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 21.8 | 23.6 | -20.8 | 28.4 |
| **එකතුව** | **100.0** | **100.0** | **1.2** | **18.6** |
| 2. **උපයෝජනය** | | | | |
| පරිභෝජනය | 64.2 | 62.2 | 4.4 | 14.9 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 18.6 | 19.8 | 2.9 | 26.5 |
| පෞද්ගලික | 13.6 | 15.4 | -1.7 | 34.5 |
| රජය | 5.0 | 4.4 | 17.6 | 4.9 |
| තොග වෙනස්වීම් | 0.6 | 1.4 | -66.0 | 208.1 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 16.7 | 16.6 | -5.9 | 17.8 |
| **එකතුව** | **100.0** | **100.0** | **1.2** | **18.6** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.5 රූප සටහන**
**2010 වර්ෂයේ ආර්ථිකය (පවත්නා මිල යටතේ)**

**භාණ්ඩ හා සේවා සැපයුම (රුපියල් බිලියන 7,329)**




**භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම (රුපියල් බිලියන 7,329)**




**සමස්ත භාණ්ඩ සහ සේවා සැපයුමෙන් දේශීය සම්පත් ප්‍රමාණය 2010 දී සියයට 76.4 ක දායකත්වයක් දැක්විය.** සියයට 32.3 ක දායකත්වයක් පැවැති දේශීය භාණ්ඩ ප්‍රමාණය වසර තුළ සියයට 15.5 කින් වර්ධනය වූ අතර, සියයට 44.2 ක් වූ දේශීය සේවා ප්‍රමාණයේ නාමික වටිනාකම සියයට 16.1 කින් වර්ධනය විය. වසර තුළ සමස්ත සැපයුමෙන් ඉතිරි සියයට 23.6 ක ප්‍රමාණය ආනයනවලින් සමන්විත වූ අතර එයින් භාණ්ඩ ආනයනවල සාපේක්ෂ දායකත්වය සියයට 20.8 ක් ද ඉතිරි සියයට 2.7 ක් සේවා ආනයන ද විය.

**2010 වසරේ දී පරිභෝජනය, ආයෝජනය සහ අපනයන යන සෑම අංශයකම ඉහළ වර්ධන වේගයක් පෙන්නුම් කරමින් පෙර වසරට වඩා ඉල්ලුම් පාර්ශ්වයේ වර්ධනයක් පැවතුණි.** පෞද්ගලික සහ රජය යන

**2.15 සංඛ්‍යා සටහන**

**පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | රුපියල් මිලියන | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) |
| 1. වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 4,835,293 | 5,602,321 | 9.6 | 15.9 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 3,967,770 | 4,557,348 | 4.4 | 14.9 | 82.1 | 81.3 |
| පෞද්ගලික | 3,116,221 | 3,684,738 | 1.0 | 18.2 | 64.4 | 65.8 |
| රජය | 851,549 | 872,610 | 19.3 | 2.5 | 17.6 | 15.6 |
| 3. ආයෝජන | 1,181,449 | 1,556,769 | -2.8 | 31.8 | 24.4 | 27.8 |
| පෞද්ගලික | 863,485 | 1,209,551 | -7.1 | 40.1 | 17.9 | 21.6 |
| රජය | 317,964 | 347,218 | 11.1 | 9.2 | 6.6 | 6.2 |
| 4. දේශීය ඉතුරුම් | 867,523 | 1,044,973 | 41.8 | 20.5 | 17.9 | 18.7 |
| පෞද්ගලික | 1,047,454 | 1,163,847 | 49.6 | 11.1 | 21.7 | 20.8 |
| රජය | -179,931 | -118,874 | -103.4 | 33.9 | -3.7 | -2.1 |
| 5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය | -313,927 | -511,796 | 48.0 | -63.0 | -6.5 | -9.1 |
| 6. විදේශීය ශුද්ධ සාධක ආදායම | -55,795 | -71,858 | 46.9 | -28.8 | -1.2 | -1.3 |
| 7. විදේශීය ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම | 336,578 | 407,967 | 21.2 | 21.2 | 7.0 | 7.3 |
| 8. ජාතික ඉතුරුම් | 1,148,306 | 1,381,082 | 46.4 | 20.3 | 23.7 | 24.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

දෙඅංශයෙහි වර්ධනය මගින් වසර තුළ පාරිභෝජන ඉල්ලුම සියයට 14.9 කින් වැඩි විය. මේ අතරතුර, 2009 වසරේ පැවැති ආර්ථික පසුබෑමෙන් අනතුරුව නැවත යථා තත්ත්වයට පත් වෙමින් 2010 වසරේ දී ආයෝජන ඉල්ලුම සියයට 31.8 කින් වැඩි විය. පෙර වසරේ පැවැති සියයට 5.9 ක සංකෝචනයෙන් නැවත යථා තත්ත්වයට පත්වෙමින් 2010 වසරේ භාණ්ඩ සහ සේවා අපනයනවල නාමික අගය සියයට 17.8 කින් වැඩි විය.

### ඉතුරුම්

**පෙර වසරේ ඉහළ වර්ධනයට සාපේක්ෂව 2010 තුළ ඉතුරුම් වර්ධන ගාමකත්වය මන්දගාමී විය.** පරිභෝජන වියදමේ පහළ බැසීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළේ භාණ්ඩ මිල ගණන් සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම හේතුවෙන් 2009 වසර තුළ ඉතුරුම් වැඩිදියුණු විය. ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පැමිණීමත් සමඟ පරිභෝජන ඉල්ලුම වැඩි වූ අතර, එමගින් දේශීය සහ ජාතික ඉතුරුම් වර්ධනය අඩු මට්ටමක පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, පෙර වසරේ සියයට 6.5 ක් වූ සම්පත් පරතරය 2010 දී සියයට 9.1 ක් දක්වා වැඩි විය.

**දේශීය ඉතුරුම් 2009 වසරේ සියයට 41.8 කින් වැඩි වූ අතර 2010 දී එය සියයට 20.5 ක් දක්වා පහළ වැටුණි.** පෞද්ගලික සහ රාජ්‍ය ඉතුරුම් අයත් වන මුළු දේශීය ඉතුරුම් 2010 වසරේ දී රුපියල් බිලියන 1,045 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ඉතුරුම් ලෙස අර්ථ දැක්වෙන රජයේ අයවැයේ ජංගම ගිණුමේ හිඟය වසර තුළ සෘණ අගයක් පැවතියද ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස 2009 වසරේ සියයට 3.7 ක අගයට සාපේක්ෂව මෙම වසරේ සියයට 2.1 ක වර්ධනයක් දැක් වූ අතර එය දේශීය ඉතුරුම් වැඩි කිරීම පිණිස දායක විය. එසේම, වසර තුළ දේශීය ඉතුරුම් අනුපාතය (ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම්) සියයට 18.7 ක් විය.

**2010 දී ජාතික ඉතුරුම් රුපියල් බිලියන 1,381 ක් දක්වා සියයට 20.3 කින් වර්ධනය විය.** පෙර වසරේ සියයට 46.4 ක් ලෙස වාර්තා වූ ඉහළ අගයට සාපේක්ෂව 2010 දී ජාතික ඉතුරුම් අඩු මට්ටමක පැවතුණි. විදේශීය ශුද්ධ සාධක ආදායම පහළ මට්ටමක පැවතීම ජාතික ඉතුරුම් මෙලෙස අඩු වීමට හේතු වූ අතර ශුද්ධ පෞද්ගලික ජංගම සංක්‍රාම සියයට 21.2 කින් වැඩි වීම හේතුවෙන් ජාතික ඉතුරුම්වල වර්ධනයක් පැවතිණි. මේ අතර ජාතික ඉතුරුම් අනුපාතිකය පෙර වසරේ පැවැති සියයට 23.7 ක මට්ටමක සිට 2010 වසර තුළ සියයට 24.7 ක් දක්වා වැඩි විය.

**විශේෂ සටහන 5**

## ස්වේච්ඡා විශ්‍රාම අරමුදල - දේශීය ඉතිරිකිරීම් ඉහළ නංවන සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක්

සමාජ ආරක්ෂණ ක්‍රමෝපායක් වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, ඒවායේ සාමාජිකයන්ට මූල්‍යමය සුරක්ෂිතභාවය සහ ස්ථාවර බව ලබාදෙන අතරම රටක ඉතිරිකිරීම් මට්ටම වර්ධනය කිරීමට දායකත්වය සපයනු ලබයි. එවන් පසුබිමක් තුළ, ශ්‍රී ලංකාවේ දැනට පවත්නා විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රම මගින් කුඩා පරිමාණ ව්‍යාපාර සහ ස්වයං රැකියාවල නියුතු අවිධිමත් අංශයේ සේවය කරන බහුතරයක් පිරිස ආවරණය වීමක් සිදු නොවේ. දිගු කාලයක් තිස්සේ පැවැති පුළුල් සමාජ ආරක්ෂණ ක්‍රමයක අවශ්‍යතාවය සපුරාලමින්, කුඩා පරිමාණ ව්‍යාපාර සහ ස්වයං රැකියා අංශවල නියුතු සේවකයන්ට සිය මහළුවිය සඳහා ඉතිරි කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන සමාජ ආරක්ෂණ ක්‍රමයක් පිහිටුවීමට ගත් මූලික ප්‍රතිපත්තිමය පියවරක් වශයෙන් ස්වේච්ඡා විශ්‍රාම අරමුදලක් ආරම්භ කිරීමට රජය තීරණය කර ඇත.

යෝජිත ස්වේච්ඡා විශ්‍රාම වැටුප් අරමුදල සියළුම ශ්‍රී ලාංකිකයන්ට විවෘත වන අතර, මෙය දැනට වෙනත් කිසිදු විශ්‍රාම ප්‍රතිලාභ අරමුදලක සාමාජිකයන් නොවන පුද්ගලයන් සඳහා විශේෂයෙන්ම සකස් වූ ක්‍රමයකි. මෙම ස්වේච්ඡා විශ්‍රාම වැටුප් අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් පාලනය කරනු ලබන අතර, මෙහිදී සාමාජිකයන් ලියාපදිංචි කිරීම, දායක මුදල් රැස්කිරීම, මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම වැනි කටයුතු සඳහා ජංගම දුරකථන තාක්ෂණය යොදා ගත් සරල, අඩු වියදම් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් භාවිතා කෙරෙනු ඇත.

ස්වේච්ඡා විශ්‍රාම වැටුප් අරමුදල දෙයාකාරයක අවශ්‍යතා සපුරන අන්දමින් සකස් වී ඇත. පළමුව, මෙම අරමුදල මගින් එහි සාමාජිකයන්ට ඔවුන්ගේ විශ්‍රාම දිවිය පුරාවට සමාජ ආරක්ෂණයක් සහ මූල්‍යමය ස්ථාවරභාවයක් ලබා දෙයි. මාසිකව ලැබෙන විශ්‍රාම වැටුප ඔවුන්ගේ දෛනික සහ සෞඛ්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන බැවින් විශ්‍රාමිකයන් සමාජයට හෝ රජයට බරක් නොවන බව විශේෂයෙන් කිවයුත්තක් නොවේ.

දෙවනුව, මෙම විශ්‍රාම වැටුප් අරමුදල මගින් අප ජනතාවගේ ඉතිරි කිරීමේ පුරුදු වර්ධනය කිරීම ද සිදු කෙරෙනු ඇත. 2010 වසරේ දී, ශ්‍රී ලංකාවේ දේශීය ඉතුරුම් අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 18.7 ක් විය. තවද 2010 දී දේශීය ඉතුරුම්, ශුද්ධ සාධක ආදායම සහ විදේශයන්ගෙන් ලද ශුද්ධ පෞද්ගලික සංක්‍රාමද ඇතුළත් ජාතික ඉතුරුම් අනුපාතය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 24.7 ක් විය. ඒ සමගම, 2016 ට පෙර ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය එ.ජ ඩොලර් 4,000 ක මට්ටමට ළඟාවීමට නම් ජාතික ඉතුරුම් අනුපාතය සියයට 30 ක් දක්වා ඉහළ යා යුතුය. මෙම ආයෝජන හිඟය, විදේශ ණය සහ ආයෝජනයන්ගෙන් පියවිය හැකි වුවත්, දේශීය ඉතුරුම් සමඟ සසඳන කල, එම විදේශ මූලයන් සඳහා දැරිය යුතු වියදම සහ අවදානම සැලකිය යුතු අන්දමින් ඉහළ මට්ටමක පැවතිය හැකිය.

දැනට ඇස්තමේන්තුගත කර ඇති ආකාරයට, කුඩා පරිමාණ ව්‍යාපාර, ස්වයං රැකියා සහ අවිධිමත් අංශයේ රැකියාවල නියුතු මිලියන 4 ක් පමණ වන ජනතාවකට මෙම අරමුදල සමග සම්බන්ධ වී මෙම යෝජනා ක්‍රමයෙහි ප්‍රතිලාභ භුක්ති විඳිය හැකිය. එබැවින්, මෙම ස්වේච්ඡා විශ්‍රාම වැටුප් අරමුදල, රියදුරන්, වඩුවන්, කාර්මිකයන්, වෙළෙඳුන්, ගොවියන්, ධීවරයන් සහ විදේශ රැකියාවල නියුතු වූවන් වැනි වෘත්තීන් රාශියක යෙදෙන්නන් අරමුණු කොට පිහිටුවනු ඇත. එයට අමතරව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු වූවන්, ගෘහ සේවිකාවන්, ළමා රැකවරණ සේවකයන්, රාජ්‍ය නොවන සංවිධානවල සේවකයන් වැනි දැනට වෙනත් කිසිදු සමාජ ආරක්ෂණ අරමුදලකට දායක නොවන පෞද්ගලික අංශයේ අනියම් සේවකයන්ටත්, නීතිඥයන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, උපදේශකවරුන්, විශේෂඥවරුන්, මාධ්‍යවේදීන්, සංගීතඥයන්, විනෝදාස්වාදය සපයන්නන්, ක්‍රීඩකයන්, රූපලාවණ්‍ය ශිල්පීන් වැනි ස්වයං රැකියාවල නියුක්ත වෘත්තිකයන්ටත් මෙම යෝජනා ක්‍රමයෙන් ඉමහත් ප්‍රතිලාභ ලැබිය හැක.

කුඩා පරිමාණ ව්‍යාපාර සහ ස්වයං රැකියාවල නියුතු වූවන්ගේ පොදු ලක්ෂණයක් වන්නේ ඉතා අඩුවෙන් ඉතිරි කිරීමේ පුරුද්දයි. එම නිසා, ඔවුන් සැලසුම් නොකළ විශ්‍රාම දිවියක අනිටු ප්‍රතිවිපාකවලට ඉතා පහසුවෙන් ගොදුරු වේ. එබැවින්, මෙම ස්වේච්ඡා විශ්‍රාම වැටුප් අරමුදල, කුඩා පරිමාණ ව්‍යාපාර සහ ස්වයං රැකියාවල නියුතුවූවන්ට සිය විශ්‍රාම දිවිය වෙනුවෙන් ඉතිරි කිරීමට මාර්ගයක් සපයන ඉතා වැදගත් ප්‍රතිපත්තිමය පියවරකි. මෙයට අමතරව, ස්වේච්ඡා විශ්‍රාම වැටුප් අරමුදල දිගු කාලීන අරමුදලක් වන බැවින්, එයට සිය ආයෝජන අරමුණු සහ අවදානම් ධාරණ මට්ටමට ගැලපෙන දිගු කාලීන වත්කම්වලින් සමන්විත සැලකිය යුතු මට්ටමින් විවිධාංගීකරණය වූ ආයෝජන කළඹක ආයෝජනය කිරීමට හැකිවනු ඇත. එමගින්, මෙම අරමුදලට, දේශීය ඉතිරිකිරීම් වැඩි කිරීමට සඵලදායී අන්දමින් දායකවිය හැකි අතරම රටේ සංවර්ධනය සඳහා උපකාරී වීමට ද හැකියාව ලැබේ.